# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ වෙසක් පුර අටවක පෝදා 2023 අප්‍රේල් 27 බ්‍රහස්පතින්දා BUDUSARANA THURSDAY APRIL 27, 2023

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 43 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13




නාවල සිරි සිද්ධාර්ථාරාම මහා විහාරයේ
බුද්ධ ප්‍රතිමා වහන්සේ

ඡායාරූපය -
රංජිත් අසංක



# උදාවන වෙසක් මංගල්‍යය අර්ථවත් ලෙස සරසමු

**අපගේ මහ බෝසතාණන් වහන්සේ සාරසංඛ්‍ය කල්ප ලක්ෂ වාරයක් උතුම් පාරමීධර්ම සම්පූර්ණ කර ලුම්බිණි සාල වන උද්‍යානයේ දී මහාමායා මව් කුසින් මේ මනු ලොවට වැඩම කිරීම සිදුවූයේ වෙසක් පුන් පෝ දිනක යි.**

ඒ වගේම පාරමීධර්ම සපුරාගෙන සිටි මහා බෝසතාණන් වහන්සේ බුද්ධගයාවේ නේරංජනා ගංගාව අසබඩ වජිරාසනය මත ජය ශ්‍රී මහා බෝධි සෙවණේ දී දසමාර සේනාව පරදවා  උතුම් සම්බුද්ධත්වයට පත්වූ සේක.

අපට වෙසක් පෝ දා සිහිවන අනෙක් කරුණ නම් උන්වහන්සේ බුද්ධකෘත්‍ය අවසන් කර කුසිනාරානුවර උපවර්තන සල් උයනේ දී සල් රුක් සෙවණේ අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ ආකාරය යි. එදා අපගේ භාග්‍යවතුන් වහන්සේ කුසිනාරානුවර උපවර්තන සල් රුක් සෙවණේ අවසන් වතාවට සැතපී වදාළ මොහොතේ බොහෝ අසිරිමත් දේ සිදු වුණා. පිපුණ සල් මලින් සල් රුක් වැසී ගියා.

තථාගතයන් වහන්සේට පූජා පිණිස මල් ගිලිහී සම්බුදු සිරුර මත පතිත වුණා. ඒ වගේම තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍ය මදාරා මල් උන්වහන්සේගේ සම්බුදු සිරුර මතට වැටෙන්නට වුණා. දිව්‍ය සඳුන් කුඩු අහසින් විසිරී මුළු උද්‍යානය ම එකම සුගන්ධයෙන් සුවඳවත් වුණා. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍ය තූර නාද අහසේ වාදනය වුණා.

සියල්ල දන්නා සියල්ල දක්නා භාග්‍යවතුන් වහන්සේ වදාළා පින්වත් ආනන්ද, මෙ පමණකින් නම් තථාගතයන් වහන්සේට සත්කාර කළා වන්නේ නැහැ. බුහුමන් දැක්වූවා වන්නේ නැහැ. තථාගතයන් වහන්සේ පිදුවා වන්නේත් නැහැ. පින්වත් ආනන්ද, යම් භික්ෂුවක් වේවා, භික්ෂුණියක් වේවා. උපාසකයෙක් වේවා, උපාසිකාවක් වේවා, ධම්මානුධම්ම ප්‍රතිපදාවෙන් යුක්ත ද, සාමීචිපටිපන්න ප්‍රතිපදාවෙන් යුක්ත ද, ඔහු තථාගතයන් වහන්සේට පරම වූ ප්‍රතිපදාවෙන් පූජා සත්කාර කරන, ගෞරව

> “තථාගතයන් වහන්සේට පූජා පිණිස සුවඳ මල් ගිලිහී බුදු සිරුර මත පතිත වුණා. ඒ වගේම තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍ය මදූරා මල් උන්වහන්සේගේ සම්බුදු සිරුර මතට වැටෙන්නට වුණා. දිව්‍ය සඳුන් කුඩු අහසින් විසිරී මුළු උද්‍යානය ම එකම සුගන්ධයෙන් සුවඳවත් වුණා. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍ය තූර නාද අහසේ වාදනය වුණා.”

කරන, බුහුමන් දක්වන කෙනෙක්. ඔහු නම් තථාගතයන් වහන්සේට නියමාකාරයෙන් පූජා පවත්වන කෙනෙක් කියලා.

මේ ලෝකයේ තථාගතයන් වහන්සේ නමක් පහළ වන්නේ ඉතා කලාතුරකින්. උන්වහන්සේ ලෝකයට පහළ වන්නේ උදාර ශ්‍රේෂ්ඨ අරමුණක් ඇතුවයි. දස පාරමිතා ධර්මයන්,  විශිෂ්ට පාරමිතා ධර්ම සම්පූර්ණ කර ගනිමින් විශිෂ්ට ඥාණයන් උපදවාගත් භාග්‍යවතුන් වහන්සේගේ ඒ තෙමඟුල සමරන්න පෙළ ගැසෙන මේ  මොහොතේ අපට පුළුවන් නම් තවත් ගැඹුරෙන් උතුම් ප්‍රතිපත්ති ඇසුරේ රැඳෙමින්, තථාගතයන් වහන්සේට පූජා පවත්වන්නට  එය උතුම් වෙනවා.

අපි මේ සංසාර ගමනේ පැටලිලා ගමන් කරන පිරිසක් ලෙස අපගේ සිත කෙලෙස්වලින් කිළිටිවෙලා, කෙලෙස්වලින් බරවෙලා තිබෙන්නේ. අපේ ජීවිත මේ කෙලෙස් නිසා වෙහෙසට පීඩාවට පත්වෙලා තිබෙන්නේ. ඔබට පුළුවන් නම් උතුම් වෙසක් පෝදා නිමිති කරගෙන සිත පිරිසුදු කරන වැඩපිළිවෙළක් අනුගමනය කරන්න එවිට මේ සිතේ උපදින එක අකුසලයක් හෝ බැහැර කර ගන්නට පුළුවන්කම ලැබෙනවා.

තමා ශ්‍රවණය කළ එක දහම් පදයක් ජීවිතයට ගලපාගෙන තමාට අත්හරින්නට අපහසු එක අකුසලයක් හෝ එදින සිට අත්හරින්නට උත්සාහ කරනවා නම්, ඒක වෙසක් පුන් පෝ දා මල් ලක්ෂයක් පූජා කරනවාටත් වඩා, පහන් දහසක් දල්වනවාටත් වඩා, වෙසක් සැරසිලිවලින් මුළු ප්‍රදේශයම සරසනවාට වඩා උතුම් වෙනවා. මේ අන්ධකාර සිතට ආලෝකයක් ලැබෙන විදිහට තමාගේ අකුසල් හඳුනාගෙන ඒවා නිවැරැදි කර ගන්නට උදාවෙන වෙසක් පෝ දින අපි උත්සාහ කරනවා නම් එය සැබෑම බුද්ධ වන්දනාවක් කියා හඳුන්වන්නට පුළුවන්.

භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය තුළ කියා දෙන්නේ කුමක් ද? අපගේ ජීවිතය තුළ ඇතිවන ඉවසීම ධර්මය යි. ලෝ සතුනට මෙත් සිත පැතිරීම ධර්මය යි. උතුම් දහම් කතාවේ යෙදෙනවා නම් එයත් ධර්මය යි. කලණ මිතුරන් ඇසුරු කරනවා නම් එයත් ධර්මය යි. ධර්මචාරීව වාසය කරනවා නම් ධර්මය යි.

කැඩපතකට එබී බලමින් සිරුරේ අඩුපාඩු හදා ගන්නට උත්සාහ කරනවා වගේ ධර්මය නම් වූ කැඩපතට එබී අඩුපාඩු හදා ගන්නවා නම් එයත් ධර්මයක්.

එහෙම නම් අපට පැහැදිලියි වෙසක් පෝ දා සැමරීමට තොරණ ගැහුවත්, කූඩු හැදුවත්, මහා පහන් ආලෝක දැල්වුවත්, දන්සැල් පැවැත්වුවත්, භාග්‍යවතුන් වහන්සේ වදාළ ප්‍රතිපත්තියේ ගමන් කරන්නේ නැත්නම් ඒ ශ්‍රාවකයා බුද්ධ ශාසනය තුළින් බොහෝ ඈතයි.

තමාට රකින්නට අමාරු සිල්පද අධිෂ්ඨානයක් ඇතිකර ගෙන මේ වෙසක් පෝදා පටන් හෝ රකින්ට උත්සාහ කරන්න. තමන්ගේ ශාස්තෘන් වහන්සේට සමීප වෙන්න කැමැති ශ්‍රාවකයා රැකීමට අපහසු සීලය සමාදන් වෙලා ගෞරවයෙන් ආරක්ෂා කරනවා. අද සිට මම මේ බුද්ධ වර්ෂය පුරාවට ම සමාදන් වූ සිල්පදවලට හානියක් වීමට නොදී රැක ගන්නවා කියලා, බලවත් අධිෂ්ඨානයකට එනවා. එසේ කරනවා නම් අපි හිතනවාට වඩා ආධ්‍යාත්මික සුවයක් අපට ළං කර ගන්න පුළුවන්කම තිබෙනවා.

එක්තරා අවස්ථාවක අපගේ බුද්ධ මාතාව වන මහා ප්‍රජාපතී ගෝතමී රහත් තෙරණිය තමන් වහන්සේගේ ථේරී ගාථාවේ හරි ලස්සන ප්‍රකාශයක් වදාළා. "යම් කෙනෙක් පටන්ගත් වීර්යයෙන් ඉන්නවා නම්, දිවි දෙවැනි කොට ධර්මයේ හැසිරෙනවා නම්, නිතරම දැඩි වීර්ය පරාක්‍රමයෙන් යුක්තව, සමගි සම්පන්නව ශ්‍රාවක සංඝරත්නය දකිනවා නම් බුද්ධ වන්දනාව කියන්නේ ඒකයි" කියලා. බුද්ධ වන්දනාව උන්වහන්සේ ඉස්මතු කරන්නේ පටන්ගත් වීර්ය තුළින් මෙම ධර්ම මාර්ගයේ ගමන් කරන්න කියල යි.

ඒ සම්බන්ධයෙන් අපූරු සිදුවීමක් තිබෙනවා. ඈත අතීතයේ තථාගතයන් වහන්සේ මේ ලෝකයට පහළ වීමට පෙර යුගයක එක්තරා තාපසයෙක් හිටියා. මේ තාපසතුමා බොහෝ ශිෂ්‍ය පිරිසක් සහිතවයි සිටියේ. මේ තාපසතුමාට උදේ සවස දහස් ගණන් ශිෂ්‍ය පිරිස පැමිණ වන්දනාමාන කරනවා. බුහුමන් දක්වනවා. දිනක් තාපසතුමා කල්පනා කරනවා. මගේ සිසු දරුවෝ මට ගෞරව කරනවා. පුදසත්කාර කරනවා. හැබැයි මම කාට ද ගෞරව කළ යුත්තේ? මම කාටද වන්දනා කළ යුත්තේ, ගුරුවරයෙක් ලෙස මම කාට ද සැලකිය යුත්තේ ද කියා නුවණින් විමසුවා.

එවිට මෙම තාපසතුමාට දැන ගන්නට ලැබුණා තමන් වහන්සේගේ විස්මිත නුවණින් සියල්ල අවබෝධ කළ, සසරින් එතෙරට වැඩිය ඒ තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ නම් වූ උත්තම මනුෂ්‍ය රත්නයක් කලාතුරකින් මේ ලෝකයට පහළ වෙනවා කියලා.

ඒ තාපසතුමා බුදුරජාණන් වහන්සේ දැක තිබුණේ නැහැ. අද අපට වගේ වෙසක් මංගල්‍යයක් සමරන්න අවස්ථාව ලැබිල නැහැ. ඒ නිර්මල සද්ධර්මය මේ ආකාරයට විස්තර ලෙස අහන්න ලැබිලත් නොවෙයි. අඩුම ගානේ තථාගතයන් වහන්සේගේ නාමයෙන් ප්‍රතිමාවක්, බෝධීන් වහන්සේ නමක්, ධාතුන් වහන්සේ නමක් දකින්නට ලැබිලත් නෑ. නමුත් මේ තාපසතුමාගේ සිතේ යම් පැහැදීමක් ඇතිවුණා මේ ලෝකයට කලාතුරකින් බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙනවා කියලා.

ඉතින් මේ තාපසතුමා මමත් බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් සත්කාර, පුද පූජා පවත්වන්න ඕනෑ කියලා හිතලා තමාගේ ශිෂ්‍ය පිරිසට නො දන්වා ආරාමය පහළින් ගලා යන ගඟ ඉවුරේ වැලි දෑතින් එකතු කරමින් වැලි සෑයක් ඉදි කළා.


මේ වැලි සෑයට බුදුරජාණන් වහන්සේ සිහි කරමින් උදේ සවස වන්දනා කළා. වන්දනා කරලා හිතනවා " මමත් දැන් ගුරුවරයෙක් සහිත කෙනෙක්. මේ ලෝකයට කලාතුරකින් පහළ වෙන තථාගතයන් වහන්සේ මම ඇසුරු කරන ගෞරව කරන කෙනෙක්. උදේ සවස භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරන්න යන මම කෙලෙස් සහිතව ජීවත් වන්නේ කොහොම ද?" කියා වැලි සෑය මුල් කරගෙන විශාල ගැඹුරු අර්ථයක් ඒ ජීවිතය තුළ ක්‍රියාත්මක වුණා. නිතරම ශාස්තෘන් වහන්සේ ඇසුරට යන මම රාග, ද්වේෂ, මෝහ, ඊර්ෂ්‍යා එකටෙක කිරීම, ගුණමකුකම, මාන්නක්කාරකම, උඩඟුකම වැනි කෙලෙස් සහිත අදහස් ඇතිව ඒ භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කිරීම මට සුදුසු නැහැ කියා නිතර කල්පනා කළා.

ධාතුන් වහන්සේ නමක්වත් නැති යුගයක ඒ තථාගතයන් වහන්සේ සිහි කරල වැලි සෑයකට පූජා දක්වමින් අකුසල් දුරු කරන ප්‍රතිපදාවේ සිට එතුමා කටයුතු කළා.

එනිසා මේ එළඹෙන වෙසක් මංගල්‍යය අර්ථවත් කර ගන්න අපත් අකුසල් දුරු කරන ප්‍රතිපදාවේ සිට " මම මගේ භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරනවා" කියන අදහසකට එන්න ඕනෑ. ඇත්තෙන්ම අපි රාග, ද්වේෂ, මෝහ දුරු කරමින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරනවා නම් ලක්ෂ ගණන් වියදම් කොට මල් පූජාවක් කරනවාට වඩා, පහන් දස දහසක් දල්වනවාටත් වඩා එය අපේ ජීවිත සුවපත් කරන සැබෑම බුද්ධ වන්දනාවක් බවට පත්වේවි. අපගේ සසර ගමනට සුගති රැකවරණ සලසා දෙන සුන්දර බුද්ධ වන්දනාවක් බවට පත් වේවි.

එනිසා උදාවෙන වෙසක් මංගල්‍යය අකුසල් දුරු කරන ප්‍රතිපදාවේ යෙදෙමින් ඒ අමා මහා නිවන සාක්ෂාත් කර ගැනීමට අපට ශක්තිය ලැබේවා.

නයනා නිල්මිණී



# බන්ධනයන් තුළ සිරවී සිටින තාක් ...

**අද ඇඳුම් පැළඳුම් තරම් ප්‍රකට වී ඇති දෙයක් තවත් නොමැති තරම් ය. විවිධ මාදිලියේ ඇඳුම් පැළඳුම් වෙළඳපොළෙහි පිරී ගොස්ය. ඒවාට ඇති ඉල්ලුම ද ඉතා විශාල ය. ගිහි සමාජයේ ඇඳුම් පැළඳුම් විවිධ තරාතිරමේ ඒවා බවත්, ඒවාට මිම්මක් ගණනක් නැති තරමට ම සීමා රහිත වී ඇති බවත් පැහැදිලිව පෙනෙන්නකි.**

ඉහළ වටිනාකමක් සේ ම ඒවායෙහි හැඩය හා වර්ණයන් ද විවිධව පවතී. අද බොහෝ දෙනා විශාල වියදමක් දරන්නේ ඇඳුම් පැළඳුම් සඳහා ය. එය තරඟකාරී ස්වරූපයෙන් අනුන් පරයා පෙනී සිටීමට භාවිත කරන අංගයක් වී ඇති බව ද පෙනී යන්නකි.

පැවිදි සමාජය දෙස නෙත් යොමා බැලීමෙන් ගිහි ඇඳුම්වල විචිචූර්ණ බවත්, පැවිදි සිවුරේ සැහැල්ලු බවත් මනාව පෙනී යනු ඇත.

ගිහි පැවිදි සමාජය තුළ අහසට පොළව සේ විෂම ඇඳුම් භාවිතය සිදු වේ. සිවුර පිළිබඳ විමසා බැලීමෙන් ගිහි සමාජයේ ඇඳුම් මොන තරම් සංකීර්ණ වී ඇද්ද යන්න පැහැදිලි ය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ උදෙසා හඳුන්වා දුන් චීවරයට අරහත් ධජය කියා ව්‍යවහාර කරනු ඇත. කහ වත (කාසාය වස්ත්‍රය) කියා ද කීම වරදක් නොවේ.

සිවුර පිළිබඳ ආරම්භක අවස්ථාව හමුවන්නේ ඇසළ පොහෝ දිනක පැවිදි වූ සිදුහත් කුමරුට ඝටීකාර මහා බ්‍රහ්මයා කළ අටපිරිකර පූජාවත් සමඟ ය. සිදුහත් බෝසතාණෝ සව් කෙලෙසුන් නසා බුදු බව ලැබීමත් සමඟ භික්ෂු ශාසනය ආරම්භ විය. එම ආරම්භයත් සමඟ භික්ෂූන් වහන්සේ සිවුරු පරිහරණය කිරීම සිදුවිය.

බුදු සසුනේ මුල් යුගය වන විට පාංශුකූලික වස්ත්‍ර පිරිසුදු කොට සිවුර සකස් කොටගෙන ඇති බව පැහැදිලි වේ. එය සිදු වූයේ පාරවල්, සොහොන් පිළවල්, කැලිකසල ගොඩවල් ආදී අපිරිසුදු තැන්වලින් අහුලා ගත් පස්, මඩ, කැළිකසල තැවරුණු වස්ත්‍ර පිරිසුදු කොටගෙන එයින් සිවුරු සකස් කොට ගෙන ඒවා පෙරවීමෙන් ය. ඒ තුළින් භික්ෂු ජීවිතයේ අල්පේච්ඡ ගුණය ද ඉස්මතු වේ. පාංශුකූල වස්ත්‍ර එදා සුලභව සොහොන්වල තිබුණි. මියගිය අය ඔතා සොහොනට ගෙනගොස් විසිකිරීම එදා සුලබව සිදු වූවකි. පාංශුකූල වස්ත්‍ර පරිහරණය කළ බවට හොඳම උදාහරණයක් ලෙස තෙලෙස් ධූතාංග අතර පාංශුකූලිකාංග ධූතාංගය ද තිබීම පෙන්වා දීමට පුළුවන.

තව ද දේවදත්ත හිමි ඉදිරිපත් කළ පංචවර අතර ද "දිවි ඇති තෙක් භික්ෂූන් පාංශුකූලිකාංග විය යුතු ය." යන්න පෙන්වා දීමට පුළුවන.

තෙලෙස් ධූතාංග ධාරීන් අතර අග්‍රස්ථානය හිමි වූයේ මහා කාශ්‍යප මහරහතන් වහන්සේටයි. දිනක් මහ කාශ්‍යප මහරහතන් වහන්සේත්, බුදුරජාණන් වහන්සේත් මහ මඟ වඩින කල්හි බුදු හිමිට අතරමඟ ගසක් යට වාඩිවීමට සිත් විය. ඒ අවස්ථාවේ මහා කශ්‍යප හිමි උන්වහන්සේ පොරවා සිටි පටපිළියෙන් කළ සඟල සිවුර නවා ගසමුල අසුනක් පැනවීය. බුදු හිමි එහි වැඩ සිට කාශ්‍යප හිමිගේ සිවුර අතින් පිරිමැද "කාශ්‍යප ඔබගේ මේ සඟල සිවුර ඉතා මෘදු" යැයි වදාළහ.

එවිට එම සිවුර කාශ්‍යප හිමි බුදු හිමිට පූජා කළහ. එවිට බුදු හිමි කාශ්‍යප ඔබ දැන් කුමක් පොරවන්නේ දැයි විමසූහ. එවිට කාශ්‍යප හිමි, බුදු හිමි පොරවා සිටින දිරාගිය රළු වූ පාංශුකූල සිවුර ලැබෙන්නේ නම් ඉතා මැනවැයි කීහ.

ධම්ම පදයේ පණ්ඩිත වග්ගයේ සඳහන් ගාථාවක් ඒ සම්බන්ධව ඉතා වැදගත් වේ. එනම්,

යෙච ඛො සම්ම දක්ඛාතෙ
ධම්මෙ ධම්මානු වත්තිනො
තෙ ජනා පාර මෙස්සන්ති
මච්චු ධෙය්‍යං සුදුත්තරන්ති

සම්බුදු රදුන් මනා කොට දේශනා කළ සද්ධර්මය අනුව ප්‍රතිපත්ති පුරන අය මහත් ආයාසයෙන් තරණය කළ යුතු වූ සංසාර සාගරය තරණය කොට  නිවන් දකිත්.

බොහෝ සත්ත්වයින් සසර දුක් විඳිමින් ගැවසෙන අයුරුත්, ස්වල්ප දෙනෙක් ධර්මාවබෝධයෙන් සසරින් එතෙර වන අයුරුත් ඉහත ගාථා ධර්මය තුළින් මනාව පැහැදිලි කොට ඇත.

රාගයෙන් රත්ව, ද්වේෂයෙන් දූෂිතව, මෝහයෙන් මුළාව සත්වයා සසර කතර තුළ අනන්ත අප්‍රමාණ දුක්වලට මැදි වී ගමන් කරනු ඇත.

ලොව බුදු කෙනෙක් පහළ වන්නේ දුක් විඳින සත්වයා සසර කතරින් මුදවාලනු පිණිස ය. නමුදු සියල්ලෝ ම සසර කතරින් එතෙර නොවෙති. එයට හේතුව වන්නේ කාමයෙන් ඇලී ගැලී අස්මිමානය, මමායනය ආදී බන්ධනයන් තුළ සිරවී සිටින බැවිනි.

"පඤ්ඤවන්තස්සායං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස"

මාගේ ධර්මය ප්‍රඥවන්තයින් උදෙසායි. අනුවණයින්ට නොවේ යනුවෙන් පැහැදිලි වන්නේ ප්‍රඥවන්තයින් ධර්මය පහුරක් කොටගෙන සසර කතරින් ජය ගන්නා ආකාරයයි.

අද බහුල වශයෙන් විවිධ ආමිසමය පූජාවන් පිරුව ද ධර්ම මාර්ගයෙන් දුරස් වී ඇති බව පෙනෙන්නට තිබේ.

මානය ප්‍රධාන අකුසලයක් වශයෙන් පැනනැඟීම හේතුවෙන් අකුසල් සිදුවීමේ ප්‍රවණතාව වැඩි වී ඇත. ධර්මය ඇසුව ද බොහෝ දෙනෙක් තුළ හදවතේ ධර්මය නැත. එනිසා දුක් ගිනිදැල් මොහොතින් මොහොත උත්සන්න වෙමින් පවතී. ස්වභාව ධර්මය හා දෙවියන් පවා කෝප වන අයුරින් අධාර්මික ක්‍රියා නිරන්තරයෙන් සිදුවේ.

"ධම්මේ ධම්මානුවත්තිනො" යනුවෙන් දහමට අනුව පැවැත්ම අනුමත කළේ එම හේතුවෙනි.

බුදු හිමි තම ගුරුවරයා වශයෙන් තබා ගන්නා ලද්දේ ද උතුම් ශ්‍රී සද්ධර්මයයි. මවකට පියකුට කළ නොහැකි දෙයක් ධර්මය විසින් සිදු කරනු ඇත. එනම් සසර දුක් දුරුකොට නිවන් සැපත ලබා දීමයි. එවැනි උතුම් ශ්‍රී සද්ධර්මයක් හරහා සත්වයා සසර කතරින් එතෙර වීමට උත්සාහවත් වීම බුද්ධිමත් ක්‍රියාවයි. එසේ නොවන්නේ නම්, සත්වයා මෙතෙරට ම එති. මැරි මැරී නැවත නැවත දුකට ම පත් වේ.

උසස් මනසක් ඇති සෑම දෙනෙක් විසින් ම උතුම් ශ්‍රී සද්ධර්මය අනුගමනය කිරීම හා ප්‍රායෝගික ජීවිතය තුළ එය ක්‍රියාත්මක කිරීම ප්‍රඥාගෝචර ය. එසේ කිරීම මෙලොව පරලොව දුක් දුරු කර නිවන් පිණිස හේතු වේ. ඉහත කරුණු සැලකිල්ලට ගෙන දුර්ලභව ලද මිනිසත් බව ගුණධර්ම තුළින් පෝෂණය කොට ගෙන ගෙවන කෙටි කාලය තුළ යුතුකම් හා වගකීම් ඉටු කරමින් මිනිසත් බව අර්ථවත් වන අයුරින් ජීවත් වීම ඉතා වැදගත් වේ.



මහව,උඩගම ශ්‍රී ඉන්ද්‍රසුමන මහ පිරිවෙන්හි ප්‍රවීණාචාර්ය , ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛන ශාස්ත්‍රී

**ගලගෙදර රතනවංස හිමි**

## දෙලොව දියුණුව ගැන සිතනවා නම්....

ගිහි බෞද්ධයාගේ ඒකායන අරමුණ විය යුතු දෙලොව දියුණුව සැලසෙන ලෙස ජීවිතය පවත්වා ගැනීම ය. හේ අලස වූයේ නම්, ඒ අරමුණට යා නොහැකි ය.

දියුණුව බලාපොරොත්තු වන පුද්ගලයාට උත්සාහය, වීර්යය අත්‍යවශ්‍ය ය. කෙනෙක් සියල්ල හිමි වන්නේ කළ පින් හා තම වාසනා ගුණය මත බව සිතති. එසේ ලැබෙන දෙයක් ලැබේ යැයි කල් හරින්නේ අලසයන් ය.

උත්සාහවත් පුද්ගලයා සතු ගුණාංග අතර, දක්ෂ බව, අනලස් බව, තැනට සුදුසු නුවණ, සුදුසු දේ කිරීම, මනාව සංවිධානය වීම ආදිය සුවිශේෂී වේ. යම් කෙනකුට මෙම ගුණයන් වේ නම් ඔහුට මෙලොව ලද නොහැකි ජයග්‍රහණයක් නැත.

එක් අවස්ථාවක සැරියුත් මහ රහතන් වහන්සේ දේශනා කොට වදාළේ අලස පුද්ගලයකු දැකීමට පවා තමන් වහන්සේ අකැමැති බව ය.

ස්ථානෝචිත ප්‍රඥාව යනු තැනට සුදුසු නුවණ යි. ජීවන ප්‍රතිපදාව මනාව හසුරුවා ගැනීමේ දී තැනට සුදුසු නුවණ අත්‍යවශ්‍ය ය. සෑම අවස්ථාවක දී ම එක හා සමාන තීන්දු තීරණ ගත නොහැකි ය. දැඩි විය යුතු තැන දැඩි තීරණ ගැනීමටත්, මෘදු විය යුතු තැන මෘදු තීරණ ගැනීමටත් හැකි විය යුතු ය. ඒ තීරණය තමන්ට හෝ අනුන්ට හෝ අනර්ථයක් නොවිය යුතු ම ය.

සමබර ජීවිතයක් ගත කිරීමට නම් උපාය කෞශල්‍යය ඇත්තෙක් විය යුතුය. පොතපතින් ලබා ගන්නා දැනුම සේ ම ජීවන අත්දැකීම් ඇසුරින් ද ඒ ගුණාංගය ඔපමට්ටම් කර ගත හැකි වේ.

ජීවන ප්‍රතිපදාව තුළ සරු නිසරු දෙය තෝරා බේරා ගැනීමේ හැකියාව ද වෙසෙස් ය. බුද්ධි ගෝචර පුද්ගලයා නුසුදුසු දෑ බැහැර කොට සුදුසු දෙයම තෝරාබේරා ගනී. එහි දී තමන් කරන කියන දැයෙහි අනුසස් හා විපාක හඳුනා ගනිමින් පාපයෙන් බැහැරවේ. එම පුද්ගලයා ආත්මාර්ථකාමී හැඟීමෙන් පෙළෙන්නෙක් නොවේ. අන්‍යයන්ගේ සුබ සිද්ධිය ද ඔහුගේ බලාපොරොත්තුවයි.

මෙවැනි ගුණාංග ජීවිතයට පුරුදු පුහුණු කරන ඒ සඳහා උත්සාහවත් වන පුද්ගලයාට දෙලොව අභිවෘද්ධිය සලසා ගැනීම අසීරු නො වනු ඇත.

**සියඹලාගොඩ ධම්මින්ද හිමි**



බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
දුරකථන - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## වෙසක් පුර අටවක 2023-04-27

# උතුම් ජීවිතයකට හිමිකම් කියමු

සමාජ විවිධත්වය නිර්මාණය වන්නේ පුද්ගල විවිධත්වය අනුව ය. හිතකාමී පරිසරයත්, කලකෝළාහල පිරී ගැටුම් සහිත පරිසරයත් සැකසෙන්නේ මේ විවිධත්වයට අනුව ය.

ඔවුනොවුන්ගේ ආකල්ප හා චර්යාවන් මත නිර්මාණය වන මේ විවිධත්වය මිනිසාට, සතා සිවුපාවුන්ට සේ ම ගහකොළවලින් සුසැදි ස්වභාවික පරිසරයට ද හිතකර ලෙස ගොඩනගා ගැනීමේ වගකීම ඇත්තේ ද මිනිස් සත්ත්වයා අතේ ම ය.

සම්බුදු දහම අපට මඟ පෙන්වන්නේ ඒ යහපත් සමාජය ගොඩනඟන්නට ය. ඒ සමාජය තුළ දුසිල්වතුන් නැත. සුසිල්වත්හු ම වෙති.

යො වෙ වස්සසතං ජීවෙ
දුස්සීලො අසමාහිතො
එකාහං ජීවිතං සෙය්‍යො
සීලවන්තස්ස ඣායිනො

ධම්මපදයේ එන මෙම ගාථා රත්නයට අනුව තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළේ දුසිල්වත් පුද්ගලයෙක් ව වසර සියයක් ජීවත් වනවාට වඩා සිල්වත් දැහැමි පුද්ගලයකු ලෙස එක් දිනක් හෝ ජීවත්වීම උතුම් බව ය. සිල්වත්වීමේ අගය ප්‍රමාණය කළ නොහැකි බව එයින් ම පැහැදිලි වන්නේ ය.

සම්බුදු දහමට අනුව දුසිල්වතා නම් ගිහියන් විසින් රැකගත යුතු පන්සිල්, අටසිල් නොරකින, නොවඩන පුද්ගලයා ය. පැවිදි වී නම් පැවිදිවත නොපුරන, නොවඩන භික්ෂුහු ය.

සැබෑ බෞද්ධයා සුසිල්වතකු මිස දුසිල්වතකු නොවන්නේ ය. පවෙහි විපාක සේ ම පිනෙහි අනුසස් ද දන්නා හෙතෙම දැහැමි දිවිපෙවෙතක් ගත කරයි.

පන්සිල් සුරකින සමාජයක් වේ නම් එහි මරණ බිය නොදැනේ. මිනිසා සේ ම සතා සිවුපාවුන් ද නිදහසේ ජීවත් වේ. අතීතයේ අපේ මුතුන් මිත්තන් අතර නොවූ විරූ ලෙස අද සමාජයේ මරණ බිය වැඩි වී ඇති සැටි පෙනේ. එක් තැනෙක ආදරය වෛරයට පෙරැළී පෙම්වතා අතින් පෙම්වතිය ඝාතනය වේ. කිරි දරුවන්ට අම්මාගේ ආදරය අහිමි කරමින් සැමියා විසින් බිරිඳ ඝාතනය කරන සිදුවීම් අපමණ ය. පැළ ඉනි වැටේ සීමාවට ජීවිතයෙන් වන්දි ගෙවන අය මොන තරම් ද? සමාජයම ව්‍යසනයට හෙළන මත්ද්‍රව්‍ය වෙළෙඳාමේ ජය තමන්ට අත්පත් කර ගන්නට තවත් එවැනිම ජාවාරම් කරුවන් බිල්ලට ගන්නා අවස්ථා ලෝකයට ම පොදුය. මේ ආදී ලෙස මිනිස් ජීවිතයක අගය මායිම් නොකරන පාපතර දැඩි සිත් ඇත්තෝ මේ සමාජය අපවිත්‍ර කරන ආකාරය අද වන විට සුලබ දසුන් ය. ජන මාධ්‍යයන් ඔස්සේ එවැනි සිදුවීම් නිරන්තරයෙන් අපගේ ඇස ගැටේ. මේ පාපයේ අහිතකර බලපෑම් දුසිල්වතුන්ට අහිතකර වනවා පමණක් නොවේ. ඔවුන්ගේ පාපකාරී වැඩ නිසා අසරණ වන, ජීවිතයම කඩා වැටෙන අය මොනතරම් ද? එවැනි සමාජයක් ජීවත්වීමට කෙසේ නම් හිතකර වන්න ද?

සොර සතුරු බිය නැති, කාමය වරදවා නොහැසිරෙන, බොරුව රජනොයන, මත්ද්‍රව්‍ය - මත්වතුර නැති සමාජය මොනතරම් විශ්වාසවන්ත ද? එහෙත් යම් පිරිසක් අතින් මේ සිල්පද ආරක්ෂා කිරීමේ වගකීම දිනෙන් දින ගිලිහී යන නිසා ම සමාජය තුළ විද්‍යමාන වන්නේ අසහනකාරී බවකි. කුඩා දරුවාගේ සිට වැඩිහිටියා දක්වාම පීඩාකාරී බවෙන් ජීවත්වන ස්වභාවයකි. මානසික පීඩාකාරී බව කායික රෝගවලට ද හේතුවේ. දෛනික ජීවිතයේ සාමාන්‍ය කටයුතු පමණක් නොව රැකියාව, අධ්‍යාපනය ආදී සියලු කටයුතුවලට වක්‍ර ලෙස බලපෑම් කරයි. ඒ අහිතකර බලපෑම මෙලොවට පමණක් නොව මරණින් මතු ජීවිතයට ද හිතරක නැත.

මේ වෙසක් සමයේ හෝ මේ පිළිබඳ අවධානය යොමුකර යහපත් සමාජයක පෙර මං ලකුණු දකින්නට දුසිල්වත්කම් හැර පියා සිල්වත්කම් ප්‍රගුණ කරන්නට ඇප කැප විය යුතු ය.

# දෙලොව වැඩ අවැඩ සලසන පින් පව්

මිනිසත් බව ලැබීම දුර්ලබය. එහෙත් බොහෝ උසස් ප්‍රයෝජන ලැබිය හැකි වන්නේ ද මිනිසත් කමින් ය. ලොව්තුරා බුදු බව, පසේ බුදු බව,රහත් බව යන ලෝකෝත්තර සම්පත්තීන් සේ ම සකල ලෞකික සම්පත්තින් ද ලැබීමේ මඟ සාදා ගැනීමට උතුම් මිනිසත් බව ඉවහල් වන්නේ ය.

බොහෝ ධනය, ගේ දොර, වතු පිටි, නෑ හිත මිතුරන් පිරිවරාගෙන තම අඹුදරුවන් හා සමඟින් පස්කම් සැප විඳීම් පමණක් මිනිසත් බවින් ලබන්නට හැකි උසස් ප්‍රයෝජනය යැයි නො සැලකිය යුතු ය. පස්කම් සැප විඳීම මිනිසත් බවින් ලබන්නට ඇති ඉතා සුළු ප්‍රයෝජනයකි. මිනිසත් බවින් ලබන්නට ඇති උසස් ප්‍රයෝජනය නම්, අනාගත සංසාරයෙහි දී පිහිට වීමට ශීලසමාදානාදි කුසල ක්‍රියාවන් කර ගැනීම ය.

පස්කම් සැපය සිහිනයක් බඳු ය. කොතරම් උසස් ලෙස පස්කම් සැප ලැබුයේ ද ඒවායින් අනාගත සංසාරයට අවැඩක් මිස වැඩක් නැත. තෙරුවන් සේවනය නො කරන, ශීල සමාදානාදී පින්කම් හි නො යෙදෙන, පස්කම් සැපයෙහි ම ඇලී ගැලී ජීවත්වන නිසා සැප සොයා යමින් අනේක පාප කර්ම සිදු කරයි.

එවැනි පුද්ගලයා මරණින් පසු ඔසවාගෙන ගොස් බිමින් තබන්නා සේ අපායට වැටෙන්නේ ය. අපායෙහි උපන් ඔහුගේ මළ සිරුර නෑ හිතමිතුරන් විසින් සැරසූ මඟ පාවාඩ උඩ මහ පෙරහැරින් චිතකය කරා ගෙන ගොස් නන් අයුරින් විවිධ පුද්ගලයන් විසින් ගුණ කියා ආදාහනය කළේ ද, ඒවා අපායේ සිටින්නාට දැනෙන්නේ හෝ පෙනෙන්නේ නැත.

මිය ගිය තැනැත්තාගේ ගුණ වර්ණනා කරන කථිකයන් ද, භික්ෂූන් වහන්සේ ද, නෑ හිත මිතුරෝ ද අපායට ගිය තැනැත්තා අපායෙන් ගොඩගැනීමට සමත් නොවෙති. මරණයට පත් පුද්ගලයා ඉතා දීර්ඝ කාලයක් කළ අකුසලයන්ගේ විපාක විඳින්නේ ය. අවුරුදු කෝටි ගණනකින් හෝ ඔහුට නැවත මිනිසත් බවක් නො ලැබිය හැකි වන්නේ ය.

රිසි සේ ආහාරපාන නො ලබන, ඇඳුම් – පැළඳුම් නො ලබා අමාරුවෙන් තම අඹුදරුවන් පෝෂණය කරන, දුෂ්කර වූ ජීවිකාවක් ගත කරමින් ජීවත්වන දුගියකු වුව ද, තෙරුවන් සේවනය කරන්නේ නම්, අකුසල කර්මයන්ගෙන් වළකින්නේ නම්, පොහොය දින සිල් සමාදන් වන්නේ නම්, ඔහු හෝ ඇය මරණින් මතු නින්දෙන් අවදි වූවකු පරිද්දෙන් දෙව්ලොව දෙවියන් අතර, පෙනී සිටින්නේ ය. ඔහුගේ මළ සිරුර පැදුරු කැබැල්ලක ඔතා ගෙන ගොස් වළ දැමුයේ ද එයින් දෙව්ලොව දෙව් සැපතින් කල් ගෙවන ඔහුට වන හානියක් නැත. ඔහු තමා ලැබූ මිනිසත් බව සඵල කර ගත්තෙක් වන්නේ ය.

අඹුදරුවන් පෝෂණය කරමින් ජීවත්වන මිනිසාට සැමදාම කුසල් වැඩීමේ ක්‍රියාවන් හි යෙදෙන්නට අවස්ථාවක් නැත. එබැවින් පැරැන්නෝ මසකට දින හතරක් කුසල් වැඩීමේ ක්‍රියා කිරීම සඳහා වෙන්කර ගත්හ. ඒ පෝය දිනයන් ය. ඒ ආකාරයෙන් සතර පෝය දිනයන් නියම කරගෙන තිබුණේ තථාගත බුදුරජාණන් වහන්සේ ලොව පහළවීමටත් පෙර සිට ය. උන්වහන්සේ ද එම පෝය දින ඒ ආකාරයෙන් ම පිළිගෙන ඒ දිනයන් හි දී පෙහෙවස් සමාදන් වීම අනුදැන වදාළ සේක. එබැවින් බෞද්ධ ජනතාව ද ඒ දිනයන්හි දී සිල් සමාදන්වීම පුරුද්දක් ලෙසින් පවත්වා ගත්හ. සැදැහැති නුවණැති බෞද්ධ ජනතාව අන් කටයුතුවල නොයෙදී පොහොය දිනයෙහි සිල් සමාදන් වෙති. පොහොය දිනය දෙව්ලොව දෙවියන්ගේ ද සැලකිල්ලට භාජනය වී ඇතැයි සඳහන් වේ. දෙවියෝ මිනිස් ලොව ඇවිද පින් රැස් කරන මනුෂ්‍යයන් දෙස බලන බව ලෝකානු විවරණ සූත්‍රයෙහි වදාරා ඇති බව කියැවේ.

## සතුට සැනසීමක් වන්නට ...

අත්‍රිච්ඡතා, මහිච්ඡතාදි පාප ධර්මයන්ගෙන් තොරව තමාට ඇති දෙයින් සතුටුවිය යුතුයි. ලාභාදියෙහි සම සිතින් සතුටුවීම “සන්තුට්ඨිතා” නම් වූ උතුම් ගුණය යි. එනම් ලද දෙයින් සතුටු වීම යි. මෙම කරුණ සියලු සැපයට හේතුවන බැවින් උතුම් වූ මංගල කරුණක් වේ.

කෙනෙක් තමාට ඇති දේ, තමාට උරුම වූ දේ ගැන නොමනා කොට සලකති. අනුන්ට අයත් දේ ගැන ලෝභ කරති. එය ‘අත්‍රිච්ඡතා” නම් වේ. එය ලැබූ දෙය පිරිහීමට පමණක් නොව නොලැබූ දෙය නොලැබීමට ද හේතුවේ. එතැනින් ද නොනවතී. විවිධ විපත්වලට ද, මරණින් මතු අපායට යෑමට ද හේතු වේ. අත්‍රිච්ඡතාව හට ගන්නා වූ තැනැත්තාට, තමාට අයත් දෙය කොපමණ වටිනා දෙයක් වුවත් එය හොඳ යැයි නො හැඟේ.

හරියට එක බත් හැලියේ ඉදුණු බත් පතින් තමාට බෙදූ කොටසට වඩා අන් තැනැත්තාට බෙදූ කොටස යහපත් යැයි සිතෙන ලෙස ය. මේ හේතුවෙන් ඇතැම් විට අන් අයගේ දේ ලබන්නට යෑමෙන් තමන්ට තිබූ දෙයත් නැති කර ගන්නේ ය.

ඇතමකුට කොපමණ වස්තුව තිබුණත් ඇතිවීමක් නොවන්නේ ය. එය මහිච්ඡතාව යි. මෙසේ අධික ලෝභයෙන් යුක්ත තැනැත්තාට කොපමණ වස්තුවක් ලැබෙන්නේ ද, මෙලොව සැපතක් නම් නොවේ. ලද දෙයින් සෑහීමකට පත් නොවී තව තව වස්තු ව ම සොයන්නේ ය. එහෙයින් තමා ද ඉන් ප්‍රයෝජනයක් නො ලබන්නේ ය. පරලොව සැප පිණිස පිනක් ද නොකරන්නේ ය. නිරතුරුවම නො ලැබූ සම්පත් ලැබීමේ ආශාවෙන් ම තිබෙන දේ මද බව සිතමින් ශෝකයෙන් ම තැවෙන්නේ ය. එසේ හෙයින් මෙලොව ද, තැවී, මරණින් මතු ද අපාය උරුම කර ගන්නේ ය. මෙසේ එක් රැස් කරන්නා වූ ධනය හරියට යක්ෂාධිගෘහිත පොකුණක් සේ කිසිවකුටත් එලක් නොවන්නේ ය.

දීපා පෙරේරා





# අයිති නැති දේ තමන් සතු කර ගැනීමෙන් උපදින්නේ ශෝකයයි

**අපගේ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටි සමයේ සිදු වූ කතාවක් තමයි මේ කියන්න යන්නේ. දඹදිව ජනතාවගෙන් වැඩි පිරිසක් ජීවත් වුණේ කෘෂි කර්මාන්තයෙන්. ජේතවනාරාමයට මදක් ඈතින් ජීවත් වුණා සාධාරණ, ධර්මයට අනුව ජීවත්වන තරුණයෙක්. ඔහු බොහොම උත්සාහවන්තයි.**

මහන්සි වෙලා කුඹුරු වැඩ කළා. අඹුදරුවන් පෝෂණය කළේ දෑතේ මහන්සියෙන් හම්බ කරන දේවල්වලින්. කුඹුරු අස්වද්දන කාලයක් වුදා වුණා. දවසක් බොහෝම තදින් වහින්න පටන් ගත්තා. පාන්දර යාමය වන විට ක්‍රමයෙන් වැස්ස පායා තිබුණා. අධික සීතල නිසා නුවර වැසියෝත්, ගම්වැසියෝත් තද නින්දකට වැටී සිටියා. වැස්සත්, නගර වැසියන්ගේ තද නින්දත් වාසියට ගත්ත මං පහරන සොරු රංචුවක් කල්පනා කළා අද හොඳම දවසක් බඩු ටිකක් හොයා ගන්න. ඒත් රාත්‍රී කාලයේ නගරයට ඇතුළු වන එක බොහොම අමාරු වැඩක්. ආරක්ෂකයන් දාලා ඉන්නවා.

අපි කොහොමද නගරයට ඇතුළු වෙන්නේ'යි සොර නායකයා අනෙක් සොර පිරිසගෙන් විමසා සිටියා. එක් සොරෙක්, අයියණ්ඩි, අපි නගරයේ කාණුවෙන් ඇතුළු වෙමු. කාටවත් එතකොට අපව අල්ලා ගන්න වෙන්නේ නෑ'යි කිව්වා. හොර නායකයා මේ ගැන හොඳින් කල්පනා කරලා 'හරි මං දන්නවා හොඳ තැනක්. එතැනින් නගරයට ඇතුළු වෙන්න ගොඩක් ලේසියි'යි කියලා සොර රංචුවම පිටත් වුණා.

කාණුවෙන් නගරයට ඇතුළු වෙලා ධනවත් මිනිසෙකුගේ ගෙයකට ඇතුළු වුණා. ඔවුන් ඒ වෙනුවෙන් උමගක් ද හාරා තිබුණා. ගෙදර මිනිස්සු මධ්‍යයම රාත්‍රිය නිසාත්, වැස්ස නිසාත් හොඳින් නිදාගෙනයි හිටියේ. නිදන කාමරයටත්, අනෙක් කාමරවලටත් ඇතුළු වෙලා රත්රන්, මුතු, මැණික්, කහවණු ආදී වටිනා වස්තු ඔක්කොම මලුවලට දාගෙන හෙමින් හෙමින් හාරපු උමගෙන් ම පිටතට ආවා. කුරුල්ලන්ගේ මිහිරි හඬ වටින් පිටින් ටිකින් ටික ඇහෙන්නත්, කුකුළන් හඬලන්නත් පටන් ගත්තා.

ඉක්මනින් ම හොරකම් කරපු බඩු ටික සම සේ බෙදා ගන්න ඕන'යි තීරණය කළ සොර නායකයා කුඹුරු යායක් මැදට ගියා. ගෙනා බඩු සම සේ බෙදන්න පටන් ගත්තා. සොර නායකයා අතේ තිබුණු දහසින් බැඳි කහවණු මල්ලක් තමන්ගේ ඔඩොක්කුවේ හංගාගෙන තමයි ඉතිරි බඩු සම සේ බෙදන්න පටන් ගත්තේ. බඩු ටික ඔක්කොම බෙදුවා.

එළිය වැටී ගෙන එන නිසාත්, ඉක්මනින් නිවෙස්වලට යා යුතු නිසාත් කලබලයෙන් හැමෝම යන්න පටන් ගත්තා. සොර නායකයාගේ ඔඩොක්කුවේ තිබුණු කහවණු දහසේ මල්ල ඔහුටත් නොදැනීම බිමට වැටුණා. මේ කටයුත්ත සිදු වෙලා තියෙන්නේ අර තරුණ ගොවියාගේ කුඹුරේ. පාන්දරින් ම අවදි වුණු තරුණ ගොවියා ගවයින් දෙදෙනාත් අරගෙන කුඹුරට ගිහින් හාන්න පටන් ගත්තා.

බුදුරජාණන් වහන්සේ අලුයම් සමයේ මහාකරුණා සමාපත්තියට සම වැදිලා බැලුවා අද මම පිහිට වෙන්නේ කාටද කියලා. එතකොට දැක ගන්න ලැබුණා අහිංසක, සාධාරණ හා ධාර්මිකව ජීවත් වන ගොවියෙක් ඔහු නො කළ වරදකට මරණීය දඬුවම ලබන්න වෙන බව. ගොවියාගේ සාධාරණ බව ඔප්පු කරන්න සාක්ෂියක් නැති වෙන බවත් දැක්කා.

බුදුරජාණන් වහන්සේ කල්පනා කළා ඔහුට පිහිට වෙන්න. අඳනය හැඳ සිවුර පොරවා පාත්‍රයත් අරගෙන සුගන්ධ කුටියෙන් වැඩම කරලා ආනන්ද මහතෙරුන්ට කතා කළා තමන් වහන්සේ සමඟ පිණ්ඩපාතයේ වැඩම කරන්න. ආනන්ද තෙරුන් වහන්සේත්, සිවුරු හැඳ පොරවාගෙන පාත්‍රයත් අරගෙන පිණ්ඩපාතයේ වැඩම කළා. දෙදෙනා වහන්සේ ම වැඩම කළේ තරුණ ගොවියා සී සාන කුඹුර සමීපයෙන්.

ගොවියා බුදුරජාණන් වහන්සේත්, ආනන්ද තෙරුන් වහන්සේත් දැකලා බොහොම පැහැදීමටත්, සතුටටත් පත් වුණා. දුවගෙන ගිහින් මඬපිටින් ම දණ්ඩ නමස්කාර කර වන්දනා කරලා කුඹුරට ඇවිත් ආයෙත් හාන්න පටන් ගත්තා. ඔහුට එක පාටරම ඇහෙන්න පටන් ගත්තා බුදුරජාණන් වහන්සේ යමක් කියනවා.

හොඳින් ඇහුන්කන් දුන්නා. බුදුරජාණන් වහන්සේ කිහිප වතාවක් ම යමක් කියනවා. තවත් හොඳින් ම ඇහුන්කන් දුන්නා 'ආනන්දය, සර්පයා දුටුවා ද? කියලා බුදුරජාණන් වහන්සේ අහන කොට ආනන්ද තෙරුන් වහන්සේ 'එසේය ස්වාමිනි, දුටුවෙමි. උග්‍ර ඝෝරවිෂ ඇති සර්පයෙක්'යි කියන දෙබස ඇහුණා.

ගොවියා කල්පනා කළා මම හැමදාම වගේ කුඹුරට වේලාවේත්, අවේලාවේත් එනවා යනවා. ඒත් අද වෙනකම් නම් විෂ ඝෝර සර්පයෙක් දැකලා නෑ. බුදුරජාණන් වහන්සේ වැඩියාට පස්සේ මම ගිහින් බලන්න ඕන'යි තීරණය කරගෙන ආරක්ෂාවට මහ මුගුරකුත් අරගෙන කුඹුරේ නියරක් සමීපයට ගියා. එතකොට දකින්න ලැබුණා පාර්සලයක්. අරගෙන ලිහලා බැලුවා. අදහා ගන්නත් අමාරුයි. මසුරන් පිරුණු මල්ලක්. ඔහු ගණන් කරලා බැලුවා. මසුරන් දහසක් තියනවා. අයිතිකාරයෙක් නැති පාර්සලයක් නේ මේක. ඒ නිසා මම යන කොට ගෙදර අරං යනවා'යි තීරණය කරගෙන අතින් හා පාදවලින් කුඹුරේම පුංචි වළක් හාරලා ඒක දමලා උඩින් පස්වලින් හා මඩවලින් වහල දැම්මා. නැවතත් කුඹුර හාන්න පටන් ගත්තා.

ගෙහිමියා උදේම වුණු විපත දැනගෙන ආරක්ෂකයින්ටත් දෙස් දෙවොල් තබමින් නැති වුණු වස්තුව හොයන්න පටන් ගත්තා. වැසි දවසක් නිසා සොරුන්ගේ පා සටහන් අනුව අයිතිකරුවනුත්, ආරක්ෂකයිනුත් දඬු මුගුරු අතැතිව සොරු අල්ලා ගන්න පිටත් වුණා. පා සටහන් අනුව ගියේ ගොවියාගේ කුඹුරට. එතැන දී දැක්කා ගොවියාගේ පා සටහනුත්.

පැමිණි පිරිස ඒ පා සටහන් අනුව වසා තිබුණු වළ හාරා බැලුවා. මුදල් පසුම්බිය දැකලා චෝදනා කරන්න පටන් ගත්තා 'රෑට සොරකම් කරලා' දවාලට හොඳ මිනිහෙක් වගේ කුඹුරු හානවා. අද රජතුමාට අල්ලලා දීලා මරණීය දඬුවම් ලබා දෙනවා. මේ වගේ මිනිසුන්ගෙන් අපට නිදහසේ ජීවත් වෙන්න විදිහක් ඇත්තෙත් නෑ'යි කියමින් චෝදනා එල්ල කරමින් රජතුමා ඉදිරියට පමුණුවා සිටියා.

තරුණ ගොවියාට සාක්ෂියට ඉදිරිපත් කරන්න දෙයක් ඇත්තෙම නෑ. ඔහු ඇත්ත තත්ත්වය පහදලා දුන්නා. ඒත් රජතුමා විශ්වාස කළේ නෑ. මරණීය දණ්ඩනය දෙන්න වධකයන්ට නියෝග කළා. වධකයනුත්, රජුගේ ආරක්ෂක පිරිසත් වධකස්ථානයට ඔහුව අරගෙන යන අතරේ 'ආනන්දය, සර්පයා දුටුවාද?'එසේ ය ස්වාමිනි, දුටුවෙමි. උග්‍ර ඝෝරවිෂ ඇති සර්පයෙක්'යි දිගටම කියන්න පටන් ගත්තා. එයට හේතු අහනකොට තරුණ ගොවියා කිව්වා 'රජතුමා ඉදිරියට ගෙන ගියොත් මම එතැන දී මේ කාරණය පහදලා දෙන්නම්'යි කියලා.

ආරක්ෂක සෙබළු රජතුමා ඉදිරියට ගිහින් 'ස්වාමිනි, මේ සොරා බුදුරජාණන් වහන්සේගේත්, ආනන්ද තෙරුන් වහන්සේගේත් නම් ප්‍රකාශ කරනවා. හේතුව ඇහුවම කියන්නේ නෑ. රජතුමනි, ඔබ වහන්සේ ඉදිරියේ දී පමණක් ඒක කියන්න ඉඩ ඉල්ලනවා'යි කියා සිටියා.

ඒ අවස්ථාවේ රජතුමා ඒ කාරණය විමසා සිටියා. එවිට ගොවියා සිදුවුණ සියල්ල කිව්වා. 'හොඳයි, ඔබ කියන දේ ඇත්ත දැයි බලන්න බුදුරජාණන් වහන්සේ හමුවට යන්න සූදානම් වෙන්න ඕන'යි කියා ඔහුත් අරගෙන, ආරක්ෂකයින් පිරිවරා ගෙන බුදුරජාණන් වහන්සේ හමුවට ගිහින් තොරතුරු විමසා සිටියා. එවිට බුදුරජාණන් වහන්සේ 'රජතුමනි, ගොවියා කියන දේ ඇත්ත. මමත්, ආනන්ද තෙරණුවනුත් උදේ කුඹුරට වැඩම කළා. කහවණු පාර්සලය දැකලා එහෙම කතාවක් කිව්වා'යි පහදා දුන්නා.

රජතුමා ගොවියා ගැන පැහැදීමට පත් වෙලා 'ස්වාමිනි, බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ සාක්ෂිකාරයෙක් කළ නිසයි මේ ගැන විමසා බැලුවේ. වෙන කිසිම කෙනෙක්ගේ නමක් සඳහන් කළත් මම දුන් දඬුවම නතර කරන්නේ නෑ. මරණීය දණ්ඩනය ම ලබා දෙනවා'යි කියා සිටියා.

එවිට බුදුරජාණන් වහන්සේ 'රජතුමනි, මොහුගේ ජීවිතය තොර වෙන බව දැන ගෙන තමයි මම උදෙන් ම එතැනට වැඩම කළේ.

මොහුගේ සාධාරණ බව ඔප්පු කරන්න කවුරුත් ම පිහිට නොවන නිසා මම පිහිට වුණේ'යි දේශනා කරමින් ධම්මපදයේ බාල වග්ගයේ ගාථාවකින් ධර්ම දේශනා කළා. එතැන දී ගොවියා මරණීය දණ්ඩණයෙන් නිදහස් වූවා සේ ම සෝවාන් ඵලය ලබමින් සංසාර ගමනිනුත් නිදහස් වූ බව මේ කථා පුවතේ සඳහන් වෙනවා.

තරුණ ගොවියා කොතරම් සාධාරණ හා දැහැමි වුවත් හිමි නැති දෙයකට හිමිකම් කීමට ගිහින් මහත් විපතකට පත් වුණා. ඒ නිසා තමන්ට හිමි නැති, ඒ වගේම කරන යම් ක්‍රියාවකින් ප්‍රති ක්‍රියා ලෙස සිත්තැවුලට හෝ අඬන්න හෝ වෙනවා නම් කොපමණ වාසියක් පැමිණියත්, ප්‍රයෝජනයක් ලැබුණත් එවැනි කටයුතු නොකර සිටීම සතුටින් ජීවිත්වීමට හේතු වෙන බවත් මේ කතා පුවත පෙන්වා දෙනවා.



ආචාර්ය
**පදියතලාවේ අමරවංශ හිමි**



# බුදුරදුන්ගේ දෙවැනි ලංකාගමනය සිදුවූයේ බක් අමාවක පෝදාක ය

**ගෞතම බුදුරජාණන් වහන්සේගේ ලංකාද්වීපයට වැඩමවීම් තුනක් ගැන මහාවංශයෙහි සඳහන් වෙයි. මහාවංශය යනු මුලදී සිංහලෙන් රචනා කර තිබී ධාතුසේන රජුගේ කාලයේ දී මහානාම හිමියන් විසින් පාලි භාෂාවට පරිවර්තනය කරන ලද ශ්‍රේෂ්ඨ ග්‍රන්ථයයි.**

රට ජාතිය හා සංස්කෘතිය පිළිබඳ ලියැවුණු මෙවැනි කෘතියක් ලොව වෙනත් කිසිදු රටකට නොමැත. ඉන්දියානු ඉතිහාසය ඌණ පූර්ණය කරගත්තේ ද මහාවංශය ඇසුරෙන් ය.

මහානාම හිමියන් විසින් මහාවංශයේ මුල් කොටස රචනා කළ අතර, පසු කාලීනව දෙවැනි හා තුන්වැනි කොටස් රචනා කරනු ලැබ ඇත. එම කොටස් චූලවංශ නමින් හැඳින්වීම ද වරදකි. ඒවා නම් කළ යුත්තේ මහාවංශයේ දෙවැනි හා තුන්වැනි කාණ්ඩ වශයෙනි.

මහා වංශයේ පළමු පරිච්ඡේදයේ බුදුරදුන්ගේ ලංකා ගමන් පිළිබඳ දෙතැනක කරුණු දැක්වේ. බෝධි මූලයෙහි වැඩ සිටිමින් සිය අනාගත මෙහෙයුම් සිහිපත් කළ අවස්ථාවෙහි බුදු වී නවවැනි මස දුරුතු පුර පසළොස්වක දා මහියංගණයට ද, බුදුවී පස් වසකින් බක් පුර පසළොස්වක් දා නාගදීපයට ද බුදු වී වසර 8කින් වෙසක් පුර පසළොස්වක දා කැලණියට ද වැඩම කළ බව එහි සඳහන්ව ඇත.

පළමු හා තුන්වැනි ගමන් ඒ වූ පරිදිම සිදු වුවත් දෙවැනි ගමනේ දින වකවානු වෙනස් වී ඇත. ඒ පිළිබඳ මහා වංශයෙහි පළමු පරිච්ඡේදයේ 681 -684 ගාථාවල මෙසේ සඳහන් වේ.

**බෝධිතෝ පංචමේ වස්සේ –**
**වසං ජේතවනේ ජිනෝ**
**මහෝදරස්ස නාගස්ස –**
**තථා චූලෝදරස්ස ච**
**මාතුලභාගිනෙය්‍යානං –**
**මණිපල්ලංක හේතුකං**

**දිස්වා සපරි සජ්ජානං –**
**සංගාමං පච්චුපට්ඨිතං**
**සම්බුද්ධෝ චිත්ත මාසස්ස –**
**කාලපක්ඛේ උපෝසථෙ**

**පාතෝයේව සමාදය –**
**පවරං පත්ත චීවරං**
**අනුකම්පාය නාගානං –**
**නාගදීප මුපාගමී**

බුද්ධත්වයෙන් පස්වැනි අවුරුද්දෙහි බුදුරදුන් දෙවුරම්හි වැඩ වසන්නේ, මහෝදර හා චූලෝදර යන මාමා බෑනා දෙදෙනාගේ මැණික් පුටුවක් අරබයා යුද වැදීමට යන සංග්‍රාමය දැක නාගයන්ට අනුකම්පා පිණිස බක් අමාවක් පෝය දා නාගදීපයට වැඩම කළ සේක.

මහාවංශයේ ඓතිහාසික සටහනෙහි දැක්වෙන්නේ බුද්ධත්වයෙන් පස්වන අවුරුද්දෙහි බක් අමාවක් පෝය දා නාගදීපයට වැඩම කළ බවයි. එම සටහන වෙනස් කර ලිවීමට හෝ දේශනා කිරීමට කිසිවකුටත් අයිතියක් නැත.

චූලෝදර, මහෝදර දෙදෙනාගේ සංග්‍රාමය ඇරඹුණේ බක් අමාවක් පෝය දා වුව ද බොහෝ පිරිස් ලියන විටත්, දේශනා කරන විටත් සඳහන් කරන්නේ බුදුන් වහන්සේගේ දෙවැනි ලංකා ගමන බක් පුර පසළොස්වක් දා සිදුවූ බවයි. මෙය නිවැරැදි විය යුතුමයි.

මෙසේ වැරැදි ලෙස සඳහන් කිරීමට හේතු විනැයි සිතිය හැකි කරුණු කිහිපයක් ඇත.

පළමුවැන්න නම් ඉතිහාසය නිවැරැදිව දැන නොසිටීමයි.

දෙවැන්න නම් පසුව සඳහන් වන නිවැරැදි කරුණ නොතකා බෝධි මූලයේ දී කළ අධිෂ්ඨානය අනුව බක් පුර පසළොස්වක් දා නාගදීපයට වැඩම කළ බව සඳහන් කිරීමයි.

තුන්වැන්න නම් බුද්ධ චරිතයට අදාළ බොහෝ වැදගත් කරුණු පසළොස්වක දා සිදුවී ඇති හෙයින් ඒ අනුව සිතා බක් පසළොස්වක දා වැඩම කළ බව සඳහන් කිරීමයි.

මහාවංශය වීර කාව්‍යක් ලෙස ද සමහරු හඳුන්වති. බුදුරදුන්ගේ මෙන් ම හෙළ රජදරුවන්ගේ වීර ක්‍රියා වර්ණනා කරන බැවින් එසේ හැඳින්වීම වරදක් නැත. එහෙත් එය පැහැදිලිව ම අපේ රටේත්, ජාතියෙත්, සම්බුද්ධ ශාසනයෙත් ඉතිහාසය අනුපිළිවෙළින් සඳහන් වන ඉතිහාස ග්‍රන්ථයකි. එහි සඳහන් කරුණ සෙල්ලිපි හා වෙනත් වංශ කතා මඟින් ද තහවුරු වේ.

ශ්‍රේෂ්ඨ පුරාවිද්‍යාඥයකු වූ සෙනරත් පරණවිතාන ශූරින් බුදුරදුන්ගේ ලංකා ගමන් පිළිබඳ පුරාවිද්‍යාත්මක සාක්ෂි නැතැයි කියා එම ගමන් පිළිනොගනී. එහෙත් වර්තමාන ලෝකයේ ඓතිහාසික කරුණු සියල්ලම පුරාවිද්‍යා සාධක මත පිළිගැනෙන ඒවා නොවන බව ද අප වටහාගත යුතු ය. එබැවින් සෙනරත් පරණවිතානයන්ගේ මතය ප්‍රතික්ෂේප වෙයි. මහාවංශයේ සඳහන් මතය පිළිගැනීමට සිදු වෙයි.

බුදුරදුන් අප රටට වැඩම කිරීම තරම් වෙනත් කිසිදු කෙනකුගේ පැමිණීමක් අපට වැදගත් වන්නේ නැත. එම වැඩම කිරීම් පිළිබඳ දින වකවානු සහිතව මහාවංශයේ එන සඳහන් පිළිගෙන රටට ජාතියට හා බුදුසසුනට ද වැදගත්කමක් ලැබෙන ලෙස වාර්ෂිකව එම බුද්ධාගමනයන් සිදුවූ දිනවල පින්කම් හා උත්සව පවත්වා සැමරීම් කළ යුතුයි.

එහෙත් බටහිර ආක්‍රමණිකයන්ගේ හා බටහිර ගැත්තන්ගේ බලපෑම් නිසා දෝ ඒවා ද වෙනස් වී ඇත.

පළමු බුද්ධාගමනය සිදුවූ දුරුතු පුරපසළොසවක් දා මහියංගණයේ උත්සව හා පින්කම් පවත්වා මුළු මහත් ජනතාවගේ අවධානය ඒ දෙසට යොමු කළ යුතු ය.

දෙවැනි බුද්ධාගමනය සිහිකරමින් වාර්ෂිකව බක් අමාවක පෝ දා නාගදීපයේ දී ප්‍රධාන උත්සව හා පින්කම් සිදු කළ යුතු ය.

තුන්වැනි බුද්ධාගමනය සිහි කර සෑම වසරකම වෙසක් පුර පසළෝවක දා කැලණි විහාරයේ දී ප්‍රධාන උත්සවය හා පින්කම් පැවැත්විය යුතු ය.

එසේ කිරීමෙන් බෞද්ධ ජනතාව තුළ බුද්ධාලම්බන ප්‍රීතිය ඉතා ඉහළින් ඇති වන අතර, එය රටේ හා ජනතාවගේ අභිවෘද්ධියට ද හේතු වේ. එසේ නොකිරීම මෙන්ම දින වකවානු වරද්දා බුද්ධාගමනයන් සිහිපත් කිරීම රටේ හා බොදු ජනතාවගේ පරිහානියට හේතු වේ.



ශ්‍රී පඤ්ඤානන්ද ධර්මායතනයේ
දුම්රියපළ පාර, කැලණිය
**බෙංගමුවේ නාලක අනු නාහිමි**

# සිත පිරිසුදු කර ගැනීමට නම්...

ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය යන වැරැදි සතර කර්ම ක්ලේශයෝ ය. ආර්ය ශ්‍රාවක තෙමේ මේ අපිරිසුදු ක්‍රියාවන් පහ කරන ලද්දේ වෙයි.

කතමස්ස චත්තාරො කම්මකිලේසා පහීණා හොන්ති පාණාතිපාතෝ බො ගහපතිපුත්ත කම්මකිලේසෝ අදින්නාදානං කම්මකිලෙසො කාමේසුමිච්ඡාචාරෝ කම්ම කිලෙසෝ, මුසාවාදෝ කම්මකිලෙසො ඉමස්ස චත්තාරො කම්මකිලෙසා පාහීණා හොන්තී ති. ඉදමවොච භගවා.

සතර කර්ම ක්ලේශයනට අයත් සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වැරැදි හැසිරීම, බොරුකීම යන කරුණු පණ්ඩිතයන්ගේ ප්‍රශංසාවට බඳුන් නොවන බව ද බුදුපියාණන් වහන්සේ වරක් සිඟාල කුලපුත්‍රයාට පෙන්වා දුන්හ.

මෙම කෙලෙස් හතරින් වැළකී පිරිසුදුවන තැනැත්තා, පුද්ගලයා වරදෙහි පොලඹවන තවත් කරුණු හතරකින් ද වෙන්වෙයි.

එනම් කෙනකුට හෝ වස්තුවකට ඇති ඇල්ම නැතහොත් කැමැත්ත (ඡන්දය) නිසා කරන පව්කම්වලින් වැළකෙයි.

ඇල්මෙන් අගතියට ගොස් පව්කම් නො කරයි.

තරහින් (ද්වේෂය) රත්ව කෝපයෙන් බරව සිදුකරන පව්වලින් ද වෙන් වෙයි.

අනුන්ගෙන් වන බිය නිසා ද (භය) නො දැනීම නැතහොත් මෝඩකමින් ද (මෝහය) සිදුවන පව්කම් ඔහු නො කරයි.

සතර අගතියට නොවැටී පාපයෙන් දුරුවීම, ආර්ය ශ්‍රාවකයාගේ ලක්ෂණය යි. මෙසේ වදාළ තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ යමෙක් සතර අගතියට වැටී පව්කම් කරමින් ධර්මය ඉක්මවා කටයුතු කරයි නම්, අවපස සඳ සේ ඔහු යසසින් පිරිහෙන බැව් ද පෙන්වා දුන්හ.

ඡන්දා දෝසා භයා මොහා - යෝ ධම්මං අතිවත්තතී

**නිහීයති තස්ස යසෝ -**
**කාලපක්ඛේව චන්දිමා**

එසේම ඡන්දයෙන්, ද්වේෂයෙන්, බියෙන්, මෝහයෙන් අගතියට නොවැටී යමෙක් පව්කම් නොකරයි නම් ඔහුගේ යසස පුරපස සඳ සේ වැඩෙන බව ද බුදුරජාණන් වහන්සේ වැඩිදුරටත් දේශනා කොට වදාළහ.

**ගැටමාන්නේ සීවලි හිමි**



# යහපතට පුරුදු කළ සිත යහපත ම ගෙන දෙයි

**සිත කියල කියන්නේ පියවි ඇසකට දැකබලා ගන්න පුළුවන් දෙයක් නොවෙයි. රුවක් වගේ ඇඳලා, අඹලා පෙන්වා දෙන්නට හැකි දේකුත් නොවෙයි. කොටින්ම කියනව නම් වස්තුවකුත් නොවෙයි. ඒක නිසාම හැඩ තලයකින් යා කරල බලන්නත් බැහැ. එහෙම නම් මේ සිත කොහේ පවතීද කියල කුහුලකුත් මතු වෙනවා. සිත පවතින්නේ හදවත ඇසුරු කොටගෙනයි.**

මේ සිතේ ගතිය කොහොමද කියලත් සොයා බලන්න ඕනේ. අප කවුරුත් දන්නවා දියපාර ලෙහෙසියෙන් ගලන්නේ පහළ ගං බලානේ. උඩුගං බලා යන්නෙ නෑනේ. පහළ ගම් බලා යන විට බොහොම ලෙහෙසියෙන් ඇදිල යනවා. එහෙම ඇදිල යනකොට ඒකට වැඩිපුරම එකතු වෙන්නෙ හොඳම දේවල් නොවෙයි. යහපත් දේවලුත් නොවෙයි. ලස්සන දේවලට වඩා අවලස්සන දේ ඉක්මණින්ම එකතුවෙලා උරාගන්න සිරිතක් තියෙනවා. ඒක නිසා මේ අසෝබන ගතියට බෙහෙවින් ඇදිල යන සිත සෝබන පැත්තට හරවගන්න ඕනේ.

ඒ විදියට හරවන්න නම් බොහොම මහන්සි වෙන්න ඕනේ. ඇප වෙන්න ඕනේ. ඒ වගේම කැපවෙන්න ඕනේ. ඒ විදියෙන් කැප වුණාම මේ හීලෑ කරගන්න අපහසු කුළුමීමෙක් බඳු වූ සිත හීලෑ කරගන්න පුළුවන්. ඒකට මහත් ආයාසයක් ගන්න ඕනේ. මහත් ආයාසයක් අරගෙන කීකරු කර ගත්තහම අනේ කොච්චර හොඳ දේවල් කරන්න පුළුවන්ද? ඒක නිසා මේ හිත නරක් කර ගන්නෙ නැතිව යහපත් ලෙසටම සකස ගන්න ඕනේ.

මේ සිත අතරක් නැතිවම ගලාගෙන යන එකක්. හරියට කම්බි රැහැන දිගේ ගලායන විදුලිය වගේ. විදුලි බුබුළ එළිය දෙමින් පත්තු වෙනවා. ඒ වුණාට දහරාව අතරක් නැතිව ගලාගෙන ගලාගෙනම යනවා. අපේ ජීවිතයත් එක්ක මේ සිත පරම්පරාවෙන් පරම්පරාවට උරුමවෙලා තියෙන ආකාරයට ඇදී ඇදී රෝදයක් වගේ පෙරළී යනවා. ඒ වුණාට මේ ගමන කවදා හෝ කෙදිනක හෝ ඉඩක් ලත් විට ගතින් ඈත් වෙනවා. ඒකට කියනවා මරණය කියලා. මරණයෙන් පස්සේ මේ සිත නතර වෙනවා ද? නෑ. නතර වීමක් නැහැ. ඒ කුණු කය අත්හැරල වෙනින් සුදුසු තැනක සිත ගිහින් නවතිනවා. නැවතිලා නැවතත් ගමන ආරම්භ කරනවා.

මැරෙන මොහොත ආවාම කොහොමද මේ සිත වැඩ කරන්නේ. කය නිසලව

> **ජීවිත රෝදය පෙරළීගෙන යනකොට ගල්, මුල්වල හැපිල ඇද කුද වෙන කොට හිත කුරුවල් වෙනවා. එහෙම නැතිව අටලෝ දහම ගැන මෙනෙහි කරල හිත හදගෙන සැනසිලි සුවය ළඟා කරගන්න ඕනේ. ඒකට සිත පුරුදු කරන්නට ඕනේ. එහෙම පුරුදු කළ සිත කිසිම දේකට සෙලවෙන්නේ නැහැ.**

තිබුණත් සසල වෙලා තියෙන සිත ජීවිත කාලය තුළ අප පුරුදු කරපු හොඳ නරක ක්‍රියාවෙන් සෙලවෙන සිතුවමක් වගේ. බොහොම බලසම්පන්නව වැඩ කරනවා. වඩාත් හොඳ සෝබන සිතිවිල්ලක එහෙම නැත්නම් සිල් සුවඳින් සුවඳවත් කරගත්තු මැනවින් වඩල තැන්පත් කරගෙන තිබුණා නම් නොවරදින වෙඩිල්ලක් වගේ ඉලක්කයටම ගිහින් යහපත් තැනකම රැඳෙනවා. සමහරු මේ චුති සිත සෝබන කරවන්නට මරණ මොහොතේ බණ කියනවා. පිරිත් කියනවා. අසෝබන නුහුරු නුපුරුදු සිතකට නම් ඒ පිරිත් බණ අල්ලන්නේ නැතිවෙන්න පුළුවන්. ඒකත් හරියටම කියන්න අපහසුයි. ගති නිමිත්ත පෙර වාසනාවකට දැඩිකොට අල්ලා ගත්තා නම් අර පුරුදු කරගෙන ආ නරක සිතිවිලි හා නරක ක්‍රියාවන් සියල්ල අහෝසි වෙලා යහපත් අරමුණු ඔස්සේ ගිහිල්ලා සුගතියක උපත ලබනවා. කවරදාකවත් පිනක් නොකරපු මට්ටකුණ්ඩලී බුදු එළිය දැකලා දිව්‍ය ලෝකයේ උපන්නා වගේ.



බුදුරජාණන් වහන්සේගේ සුමදුර දහම් හඬ අහල සැරයටියට හිරවෙලා, සිත පහදවාගෙන බණ අහල මැරිල ගිහින් මැඩියෙක්, මණ්ඩක දේව පුත්‍රයා වෙලා දිව්‍ය ලෝකයේ උපන්නා වගේ, මුළු ජීවිත කාලයම පින් දහම් කරපු මල්ලිකා දේවිය බොරුවක් කියල කොසොල් රජ්ජුරුවෝ රවටපු එක මැරෙන මොහොතේ මතක් වෙලා හත් දවසක් නරකාදියේ ඉපදිලා හිටියා. මේ නිසා තමයි හැම විටම හිත සකස් කරල පුරුදු කරල පුහුණු කරල ඉදිරියට ගෙනගියොත් නරක තැනක උපදින්නේ නැහැ.

තුන් මසක් ම එකම ගාථා පාඨයක් පාඩම් කරගන්න බැරුව හිටිය චුල්ලපන්ථක හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේ නිසාම ශාසනයේ රැඳුණා. ඒ විතරක් නොවෙයි, සුළු වේලාවක් ඇතුළත අර සිතම සකස් කරගෙන මැනවින්ම ඒ සිත දැකලා, පිරිසුදු රෙදි කඩේ කිළුට දැකලා ඒක වටහාගෙන අවබෝධ කරගෙන ඒකම පාදක කරගෙන රහතුන් වහන්සේ කෙනෙක් බවට පත් වුණා. බලන්න සිතක මහිම.

ජීවිත රෝදය පෙරළීගෙන යනකොට ගල්, මුල්වල හැපිල ඇද කුද වෙන කොට හිත කුරුවල් වෙනවා. එහෙම නැතිව අටලෝ දහම ගැන මෙනෙහි කරල හිත හදාගෙන සැනසිලි සුවය ළඟා කරගන්න ඕනේ. ඒකට සිත පුරුදු කරන්නට ඕනේ. එහෙම පුරුදු කළ සිත කිසිම දේකට සෙලවෙන්නේ නැහැ. යකඩ ඉන්න මහ සුළඟට වැනෙන්නේ නැතිවා වගේ හිත හදාගත්තෙ නැති වුනාම දුක් වෙනවා. පසුතැවිලි වෙනවා. උකටලීව කම්පාවෙලා ඉන්නවා. එහෙම ඉන්න අයට තමයි, අනේ අපට කොයිම වෙලාවකවත් සැනසිල්ලක් නෑනේ කියන්නේ.

ඉඳගන්නකොට, නැඟිටිනකොට, කනවිට, බොන විට, අඳින පළඳින විට, යන එන විට කරන කියන හැමදේක දී ම සිත මුල්කරගෙන එකම අරමුණකින් යුතුවම කරගෙන යන කොට පුදුම පහසුවක් සැනසිල්ලක් ඇතිවෙනවා. ඒ සැනසිල්ල ඇතිවෙන විට මැදහත් බවකින් හැම දෙයක් පිළිබඳ පිරිසිඳ දැක ගන්න පුළුවන්. එහෙම වෙන කොට අසිරිමත් සැනසිලි සුවයකින් සිත වෙලෙනවා. ඒ සැනසිලි සුවය තුළින් විනිවිද දකින්න පුළුවන්. ඒ කොහොමද කියනව නම් උදකප්‍රසාද මැණික, කැළඹුණු දියට වැටුනහම ඒ කැළඹුණු ගතිය මැකිල පැහැදිලිවම පතුල පෙනෙනවා වගේ. එපරිදිම විනිවිද දකින්න පුළුවන් වෙනවා. පවතින හැම දෙයකම ඇති තතු විනිවිද දකිනවා. එනිසාම සාර දෙය සාර හැටියට ගන්නත් අසාර දෙය බැහැර කරන්නත් පුළුවන් වෙනවා. ඇතිවීම, පැවතීම, නැතිවීම දකින්න පුළුවන්. සිතේ පැවතුන බර ගතිය වියැකී සැහැල්ලු ගතිය හොඳට ඇතිවෙන බවක් දැනෙනවා. මේ පිරිසිඳ දැකීම තුළින් සිත තව තවත් සුමගටම ඇදෙනවා. අරමුණු ගැනීම් අඩුවෙනවා. නියත නැති නිසා දුකක් ඇතිවෙන බව වැටහෙනවා. ඒ දුකත් ඒ ආකාරයෙන් ම නොපවතින නිසා අනාත්ම බවත් වැටහෙනවා. ඒ ආකාරයෙන් සිත ගැනත් මෙනෙහි කරන විට මැනවින් දැකීමේ නුවණැස වැඩෙනවා. ඒ වැඩීම තුළින්ම සියලු කෙලෙසුන් නැසීම දක්වා සිත දියුණු කිරීමෙන් තවත් සිතක් පහළ නොවන ස්වභාවයට පත්වෙන්න පුළුවන්.

**අයන්ති විතාන**

## පැතුම



බෝ සෙවණේ සිලි සිලියේ
බෝ පත් සෙළැවේ
අමදින විට බෝ මළුවේ
සුදු වැලි දිලිසේ

පය තබනා විට මළුවේ
මොහොතක් ගානේ
සම්දුන්මයි සිහි වන්නේ
මතකෙට මාගේ

බෝ මැඩ ළඟ බුදු හිමිගේ
රැස් විහිදෙන්නේ
අසිරිය දැක සදෙව් ලොවම
සාධු කියන්නේ
මහ බඹුවිත් දොහොත් මුදුන්
දී නමදින්නේ

අපා දෙපා සියලු සතුන් හට
මෙය දැනුණේ
ගස් වැල් මල් සියලු ම දේ
තුටින් සැනසුණේ
අඳ ගොළු බිහිරන්
සියලු දෙනා සුවපත් වූයේ
බුදු අසිරිය තුන් ලොවට ම
මෙලෙසයි දැනුනේ
මෙත් කරුණා මුදිතාවෙන්
ලොවම නැහැවුණේ

මළුව තුළ මොහොතකට
මගේ සිත නැවතුනී
අමදින කුසලයෙන්
මෙලෙස මම පතනෙමි
දිනෙක මම බෝ සෙවණේ
බවුන් වඩන්නම්
සසර දුකින් එතෙර වන්න
පැතුම් පතන්නම්

**වයි.එම්. සීලවතී**

## පින් කරමු පොහෝ දින

ගෙන්වා බිඟුන් කැළ සමනලයන් රැන
නෙක නෙක දනන් දෙනෙතට රසඳුන ගේන
දින සති ගණන් ලොවටම උඩඟුව පාන
කුසුමක් වේ ද පුදසුන මත පර නූන

මේ මල් පරව යයි හෙට දින උදෑසන
දැල්වූ පහන් යයි මොහොතින් නිවීගෙන
අවසන් හුස්ම උඩු සුළඟට ගසාගෙන
යන තුරු නොසිට පින් කරමු ද පොහෝ දින

**ගිරිඋල්ල**
**බෝපිටිය වෛද්‍ය මධ්‍යස්ථානයේ**
**වෛද්‍ය**
**කුසුම් වික්‍රමරත්න**



# දුක ශෝකය දුරු කළ හැකි මඟ

**අප සියලු දෙනාම කැමැති ශෝක පීඩා නැති, මානසික පීඩා නැති සැනසිලිදායක ජීවිතයක් ගත කිරීමටයි. ඒ සඳහා බුදු දහම තුළින් ලබා දෙන මඟ පෙන්වීම ඉතාම අගනේ ය.**

ජීවත් වෙන කාලය තුළ යම් යම් පුද්ගලයන් කෙරෙහි ඇති කර ගන්නා බැඳීම් සමඟ මුහුණ දීමට සිදුවෙන දුක් සහගත දෑ බොහෝමයි. ඒ සිදුවීම්වල කෙළවරක් පෙනෙන්නට නැත. නිවන් දක්වා බවයෙන් බවයට ඒ දුක්වලට මුහුණ දීමට සිදුවෙනු ඇත.

නමුත් යම් නුවණැත්තෙක් අවබෝධ කර ගත්තොත් සියලු සත්වයන්ගේ ජීවිතයන්හි තිබෙන අස්ථිර බව, අනිත්‍ය බව ඔහු,ඇය සැනසිලිදායක ජීවිතයකට උරුමකම් කියයි.

බුදුරදුන් දවස සිදු වූ මෙම සිදුවීමත් ජීවිතයේ සැබෑ තතු අවබෝධ කර ගැනීම පිණිස ප්‍රමාණවත් ය.

අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ සිටි සේක. සම්බුද්ධ ශාසනයේ අග්‍ර දායිකාව වූ විශාකා උපාසිකාව වෙනදා මෙන් බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට ජේතවනාරාමයට පැමිණෙන්නට වූවා ය. ඉන්පසු සැදැහැ සිතින් යුතුව වන්දනා කොට එකත්පස්ව උන්නා ය.

වෙනදා මෙන් නොව මේදින ඇය ඉතාම ශෝකයෙන් සිටින බව මුහුණේ ස්වභාවයෙන් භාග්‍යවතුන් වහන්සේ දුටුවහ. මේ පිළිබඳ බුදුරජාණන් වහන්සේ විමසූහ. " විශාකා සිටු දේවිය, අද දින ඔබගේ මුහුණ වෙනදා මෙන් නොව දැඩි ශෝකයෙන් මුසපත් වී මලානික වී ඇති බව පෙනේ. හේතුව කුමක්ද?

විශාඛා සිටු දේවියන් කඳුළු සළමින් ශෝකයෙන් මෙලෙස එයට හේතු දැක්වූවා ය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස මගේ ගෘහයේ විසූ, මට ඉතා හිතවත්, එසේම මා බෙහෙවින් ආදරය කළ මගේ දන්තා නම් මිනිබිරිය හදිසියේම මිය ගියා. ඒ ශෝකයෙන් දැඩි සේ පෙළෙමි. මට ඉතාම ලෙන්ගතුව සියලු කටයුතු කළ ඇය සිටු මාලිගයේ සියලු වැඩ කටයුතු සංවිධානය කරමින් ඉතාම හොඳින් ඉටු කළා. ඉතා ගුණ යහපත්කම් ඇති සුවිනීත තරුණියක වූ ඇයගේ හදිසි අභාවය මට දරා ගන්නට බැරි තරම් දුකක්" යැයි කීවා ය.

බුදුරජාණන් වහන්සේ දන්තා නම් මිනිබිරියගේ අභාවය නිසා ඉතාම දුකට පත් වී සිටින විශාඛාවගේ දුක, ශෝකය, සන්තාපය තුනී කරන්නට ප්‍රශ්න අසමින් මරණය පොදු ධර්මතාවක් බව ඔප්පු කිරීම සඳහා විශේෂ දේශනා ශෛලියක් භාවිත කරමින් ධර්ම දේශනා කළ සේක.

"පින්වත් විශාඛාවනි, මේ සැවැත් නුවර කොතෙක් ජනී ජනයා වාසය කරත් ද?"

"ස්වාමීනි. හරියටම ගණන කියන්න පුළුවන් කමක් නැහැ. සාමාන්‍යයෙන් පස් කෙළක් පමණ ජනතාවක් වසන බව කිව හැකි යි".

"සිටු දේවිය ඔබ මේ ජනතාවට දක්වන ආකල්පය කවරාකාර ද?"

"ස්වාමීනි බුදුරජාණන් වහන්ස, ඒ හැම කෙරෙහිම ඉතා මහත් කරුණා ඇතිව මගේම දූ දරුවන්, නෑදෑයන් සේ සලකමි. ආදරයෙන් සලකමි."

"මේ සැවැත් නුවර දිනකට මිය යන සංඛ්‍යාව කෙතෙක් ද?"

"ස්වාමීනි, තුන් හාරසියයක් දෙනා දිනපතා මිය යන බව මගෙ විශ්වාසයයි

"" මේ නුවර දිනපතා මිය යන ඒ නෑදෑයන් හා දූ දරුවන් ගැන ඔබ ශෝක කරන්නට වුණොත්, ඔබට ජීවිතයේ වෙන යම් කටයුත්තක යෙදෙන්නට කාලයක් ඉතිරි වේ ද ? "

"නැත ස්වාමීනි .."

"විශාඛාවනි, යමකුට යම් පමණ ප්‍රිය වේ ද, ඒ තරමම ඔහුට ඇයට දුක් වේදනා ශෝක ගිනි ඇති වේ. යමකුට ප්‍රිය සහගත බව අඩු ද, ඒ තරමට ඔහුට ඇයට දුක් වේදනා අඩු වේ. යම් කෙනකුට ලොව කිසිම තැනක ප්‍රියයකු නැත් ද, ඔහු ඇය සුවැත්තෙකි. එහෙයින් ශෝක නැතිව සිටීමට කැමැති අය ලොව කිසිවකුට දැඩි සේ ප්‍රිය නොකරන්නාහු ය. එවැනි පුද්ගලයන් හට "පියේහි විප්පයෝගෝ දුක්ඛෝ" යන මමත්වයෙන් බැඳී ඇති ප්‍රියජනක පුද්ගලයන්ගේ වෙන්ව යෑම නිසා ඇති වෙන දුක හිමි නොවේ. සුව සේ ජීවත් වේ. ශාන්ත සුවයට පත් වේ.

"පේමතෝ ජායති සෝකෝ
පේමතෝ ජායති භයං
පේමතෝ විප්පමුත්තස්ස
නත්ථි සෝකෝ කුතෝ භයං"

ප්‍රේමයෙන් ශෝකය හට ගන්නේ ය. භය හට ගන්නේ ය. ඒ දෙකෙන් මිදුණාහු හට ශෝකයක් නැත. බියක් නැත.

විශාකාව

"ස්වාමීනි, බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ මට සත්‍යය අවබෝධ කරවූ සේක. මරණයට පත් වීම මගේ මිනිබිරියට පමණක් වෙන් වූ දෙයක් නොවේ. සියලු සත්වයන්ට මුහුණ දෙන්නට සිදුවෙන පොදු වූ ධර්මතාවක් බව මට වැටහේ. එම නිසා මම මගේ මිය ගිය මිනිබිරිය ගැන තවත් දුක් නොවෙමි. හඬා නොවැටෙමි. ශෝක නොකරමි. හඬා කඳුළු නොසලමි. පසුතැවිලි නොවෙමි " ඇය සත්‍ය තේරුම් ගත්තාය. මේ ධර්මතාවට පොදුවේ අප සැමට විවිධ ලෙස මුහුණ දෙන්නට සිදුවේ. එහෙත් ජීවිතයේ යතාර්ථය තේරුම් ගන්නවා නම් කවර ප්‍රශ්නයක දී වුව දුක ශෝකය තුනී කර ධෛර්යයෙන් ජීවිතයට මුහුණ දීමට ශක්තිය උදාවේ.



ගාල්ල දංගෙදර , ශ්‍රී ජයවර්ධනාරාම පුරාණ මහා විහාරාධිකාරී ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක
**මුතුකණ්ඩියේ සුනෙත්ත හිමි**

# බෞද්ධාලෝක වෙසක් උත්සවය මෙවරත් උත්කර්ෂවත් ලෙස ...

ජනාධිපති ලේකම් කාර්යාලයේ සහයෝගය ඇතිව සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් 22 වැනි වරටත් සංවිධානය කරනු ලබන බෞද්ධාලෝක වෙසක් උත්සවය මැයි මස 05,06,07,08 යන දිනයන්හි පැවැත්වීමට කටයුතු සංවිධානය කොට ඇත..

ප්‍රතිපත්ති පූජාවන්ට මුල්තැන දෙමින් සංවිධානය කෙරෙන මෙම වෙසක් උත්සවයට වෙසක් පොහෝ දින සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන මූලස්ථානයේ දී පැවැත්වෙන සීල සමාදාන වැඩසටහනට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලයට යාබද නිදහස් භූමි භාගයේ දී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළු පන්දහසකකගේ සහභාගිත්වයෙන් මහා සීල සමාදන වැඩසටහනක් ද පැවැත්වීමට කටයුතු සූදානම් කොට ඇත.

පූජ්‍ය කොටපොල අමරකිත්ති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ කොළඹ දිසාවේ අධිකරණ සංඝනායක සද්ධර්ම කීර්ති ශ්‍රී කම්මට්ඨානාචාර්ය ශිරෝමණී පූජ්‍යපාද වැලිහලතැන්නේ කල්‍යාණසිරි ස්වාමීන්ද්‍රයන් වහන්සේ දෙමටගොඩ මහා විසුද්ධාරාමවාසී මන්දාරම්නුවර සුමනතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ කෝට්ටේ ශ්‍රී නාග විහාරාධිකාරී ඇතුල්කෝට්ටේ සිරි පැරකුම්බා පිරිවෙනේ නියෝජ්‍ය පරිවේණාධිපති ශාස්ත්‍රවේදී උඩුකලකන්දේ අරියරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ රත්මලාන පුරාණ විහාරාධිකාරී ශාස්ත්‍රපති කොටනෙලුවේ පුඤ්ඤානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ මුල්ලේරියාව නීලමල්ලිකාරාමවාසී දොරොව්වේ ඤාණරතන යන ස්වාමීන් වහන්සේ පෝ දින වැඩසටහන් සඳහා සම්බන්ධ වෙති. බඩධට තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන ගිහි සාකච්ඡාව වෙනුවෙන් ජනාධිපති නීතිඥ ප්‍රසන්න ලාල් ද අල්විස් , මහාචාර්ය චන්ද්‍රන ජයරත්න ඉංජිනේරු ලලිත් ද සිල්වා යන මහත්වරු සහභාගි වෙති.

ඊට අමතරව සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය සහ ජනාධිපති කාර්යාලය එක්ව වෙසක් පොහෝ දින (මැයි 05) ජනාධිපති කාර්යාලය යාබද නිදහස් භූමි භාගයේ දී සංවිධානය කරනු ලබන බෞද්ධාලෝක සාධුනාද සීල සමාධි වැඩසටහන පෙරවරු 6.00ට ආරම්භ කිරීමට කටයුතු කර ඇත. පූජ්‍ය රාජගිරියේ අරියඤාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අනුනායක හා ප්‍රධාන ලේඛකාධිකාරී මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දක්ෂිණ ලංකාවේ උප ප්‍රධාන සංඝනායක මහාචාර්ය ඉත්තදෙමළියේ ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙහිදී පෝදා වැඩසටහන් සඳහා සහභාගි වෙති. මහාචාර්ය චන්ද්‍රන ජයරත්න අමාත්‍ය ලේකම් අනුෂා ගෝකුල යන මහත්මීහු ද සහභාගි වෙති. කොල්ලුපිටිය පොල්වත්ත විහාරස්ථානය මඟින් පිරිත් සජ්ඣායනය පවත්වනු ලැබේ.

මෙම ප්‍රතිපත්ති පූජාවන්ට අමතරව පවත්වනු ලබන ආමිස පූජාවන් වශයෙන් සර්වඥ ධාතු ප්‍රදර්ශනයක්, වෙසක් පහන් කුඩු ප්‍රදර්ශනයක්, වෙසක් බැති ගී සංදර්ශනයක් සම්මේලන භූමියේ අඛණ්ඩව පැය 72 ක් පවත්වා ගෙන යන මහා දන්සැලක්, සම්මේලන මූලස්ථානයේ සිට ජනාධිපති කාර්යාලය දක්වා බෞද්ධාලෝක මාවත දෙපස අලංකාරවත් විදුලි ආලෝකය සහ තොරණක් ද ඇතුළුව බොදුසිත් පහන් කරන විශේෂාංග රැසක් මෙයට ඇතුළත් කර ඇත.

පොලීසියේ සහ ත්‍රිවිධ හමුදාවේ පූර්ණ සහයෝගයෙන් මෙම වෙසක් උත්සවය පැවැත්වේ.

බෞද්ධාලෝක වෙසක් උත්සවයේ සමාප්ති දිනයේ පහන් කුඩු තරගයේ ජයග්‍රාහකයන්ට ත්‍යාග සහ සහතික පත්‍ර ප්‍රදානය කෙරේ.

ත්‍රිවිධ හමුදා සහ පොලිස් තූර්යවාදක කණ්ඩායම් සමාජිකයන්ගේ සහ පාසල් දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් ඒ ඒ දිනයන්හි පවත්වනු ලබන බොදුබැති ගී සංදර්ශනය සමාප්ත දිනයේ දී රූපවාහිනී නාලිකාවක් ඔස්සේ සජීවීව විකාශනය කිරීමට ද බලාපොරොත්තු වේ.

හේමමාලා රන්දුනු

# සමාජ වර්ගීකරණය පිළිබඳ බුදු සමයේ ආකල්ප



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
රාජකීය පණ්ඩිත
**පයාගල සුමනසාර හිමි**

**සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ආගමික චින්තනයේ මූලික ඉගැන්වීමක් වශයෙන් වර්ණ ධර්ම සැලකේ. මිනිසාගේ ප්‍රභවය මහ බඹුගේ ශරීරාංගයන්ගෙන් සිදුවූ බව විශ්වාස කළ බ්‍රාහ්මණයෝ උප්පත්ති ස්ථාන අනුව මිනිසාගේ උස් පහත් බව ඇති වන්නේ යැයි ප්‍රකට කළහ.**

මනුස්මෘතියට අනුව මහ බඹුගේ මුඛයෙන් බ්‍රාහ්මණ වංශය ද, බාහුවලින් ක්ෂත්‍රිය වංශිකයෝ ද කලවාවලින් වෛශ්‍යයෝ ද, පාවලින් ශුද්‍රයෝ ද උපන්හ. ඒ අනුව මෙකී කුල ස්ථරායනයේ උසස් ම තැන බමුණාට ද. පහත් ම තැන ශුද්‍ර වංශිකයාට ද හිමි විය. මෙම කුල ක්‍රමයට අනුකූලව ඔවුනොවුන් අයත් කාර්ය භාරයන් ද නිර්මණවාදී පදනම මත ම තීරණය වී තිබිණි. බමුණා කුලයෙන් ශ්‍රේෂ්ඨ ය. අන්‍යයන් කුල හීන ය. බමුණෝ ශුක්ල (සුදු - පැහැපත්) වර්ණ ඇත්තෝ ය. සෙස්සෝ කෘෂ්ණ වර්ණ (කළු - නොපැහැපත්) ඇත්තෝ ය. බමුණෝ ම පිරිසුදු වෙත්. අන්‍යයෝ පිරිසිදු නො වෙත්. බමුණෝ ම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රයෝ ය. මුඛයෙන් උපන්නෝ ය. බ්‍රහ්මජය. බ්‍රහ්ම නිර්මිතය. බ්‍රහ්ම දායාදය. යනුවෙන් බ්‍රාහ්මණ වංශයෙහි උසස් බව ම වෛදික මූලාශ්‍රය ප්‍රකාශ කරයි.

ආගමික හා සමාජ කාර්යයන් හිදී බමුණා මිහිපිට දෙවියෙකි. භූසුර රජුගේ සන්නද්ධ සේනාව ද විනාශ කිරීමේ බලයක් හා ශක්තියක් බමුණාට තිබේ. ඔහු වූ කලී සියලු වරප්‍රසාද , ගරු සත්කාර , සම්මාන හිමිකරුවායි.

බමුණාගේ මූලිකත්වයෙන් නොපවත්වන ලද යාගය දෙවියන් විසින් ද නො පිළිගන්නේ ය යන මතය ද තහවුරු කොට තිබිණි. ස්ව ධර්මවලට අනුව ඉගෙනීම , ඉගැන්වීම , යාග කිරීම, යාග කරවීම, දන් දීම හා දන් පිළිගැනීම යන උසස් කාර්ය කොටස් බමුණාට නියම ව තිබිණි. බමුණාගේ දේපළවලට කිසි ලෙසකින්වත්, කුමක් නිසාවත් අත ගැසීමට රජකුට පවා නොහැකි විය. ඔහුට හිංසා පීඩා කරන රජතුමාට ද හානි සිදුවේ. මෙසේ සියලු කුල මැඩගෙන සිටි බ්‍රාහ්මණ වර්ණයට සමාජයේ ඉහළ ම තත්ත්වය හිමිව තිබූ අතර ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන අනෙක් වර්ණයන්ට බ්‍රාහ්මණ ආධිපත්‍යය යටතේ ක්‍රියා කිරීමට සිදු විය. වර්ණ ධර්ම යටතේ පහත්ම වර්ණය ලෙස සලකන ලද්දේ ශුද්‍රයන් ය. ඔවුනට හිමිව තිබුණේ එකම කාර්යයකි. එනම් ත්‍රිවිධ වර්ණයන්ට ඊර්ෂ්‍යා නොකොට මෙහෙ කිරීමයි. ශුද්‍රයා දාස කර්මය සඳහා ම මහබඹු විසින් මවන ලද බැවින් මිළ දී ගනු ලැබුව හෝ මිළ දී ගනු නොලැබූ ශුද්‍රයා දාසකම කළ යුතු ය.

දාස බව ශුද්‍රයාට උරුම වුවකි. එබැවින් ස්වාමියා විසින් දාස බවින් මුදාහල නමුදු ඔහු ඉන් නො මිදේ. කිසිවෙකුටත් ඔහු දාස බවින් මුදාහල නොහැකි යැයි ඉගැන් වූ බ්‍රාහ්මණ ධර්මය ශුද්‍ර වර්ණයට හිමි කර දී තිබුණේ සමාජයේ පහත් ම තත්ත්වයකි. භාරත සමාජයේ සිටි පඤ්චම කුලීනයන්ට හිමිව තිබුණේ මීටත් වඩා පහත් තැනකි. වේණ, නේසාද, රථකාර, පුක්කුස, චණ්ඩාල නමින් හඳුන්වා ඇති මෙකී කුල හීනයන්ට නියමිතව තිබූ කාර්ය භාරයක් ද විය. වේණ කුලයේ අය බට පොතුවලින් යම් යම් භාණ්ඩ නිෂ්පාදනය කොට ද, නේසාදයෝ සතුන් මරා මස් සම්පාදනය කිරීමෙන් ද, රථාකාරයෝ සම්වලින් භාණ්ඩ නිෂ්පාදනය කරමින් ද, පුක්කුසයෝ කසල ශෝධනය කිරීමෙන් ද , දිවි ගෙවූ අතර චණ්ඩාලයනට නියමිත වෘත්තියක් නොවූ බැවින් සිඟාකමින් ද, දිවි ගෙවීමට සිදු විය.

මෙම කුලයන්ට අයත් මෙකී කාර්ය භාරයන් ස්වාධීන කරන්නට ඔවුහු එමඟින් බැඳී සිටියහ.

“අපි සෑම දිශාවෙන් ම දස්‍යු ගෝත්‍රිකයන් විසින් වට කරනු ලැබ සිටිමු. ඔවුහු පුද පූජා නො පවත්වති. කිසිවක් ගැන විශ්වාස නොකරති. ඔවුහු මනුෂ්‍යයෝ නොවෙති. සතුරන් නසන්නා සේ ඔවුන් මරා දමන්න. දාස වර්ගයා විනාශ කරන්න.” යනුවෙන් මේ දෙපිරිස අතර පැවති සංස්කෘතිකමය වෙනස ද පිළිබිඹු වෙයි. මෙකී විෂමතාවන්ගේ ප්‍රතිඵලය වුයේ ආර්යයන් දස්‍යුන් හෙවත් අනාර්යයන් තම සතුරන් කොට තැකීම ය.

ජාති වාදී හා කුල වාදී සංකල්පයන්ගේ ප්‍රතිඵලය වුයේ පහත් යැයි සැලකෙන ජාතීන් හා කුලය උසස් යැයි සම්මත ජන කොට්ඨාසය විසින් තලා පෙලා දැමීමත් පහත් යැයි සම්මත ජන කොට්ඨාසයට අනෙක් අය භුක්ති විඳින අයිතිවාසිකම් අහිමි වීමත් ය. ජී ජී මලලසේකර හා කේ එන් ජයතිලක යන විද්වතුන් විසින් එලෙස පහත් යැයි සම්මත ජන කොට්ඨාසවලට අහිමිව ගිය අයිතිවාසිකම් වර්ගීකරණය කොට දක්වා තිබේ.

එනම් සමාන දේශපාලන අවස්ථාවන් ලබා නොදීම,

සමාන ආර්ථික අවස්ථාවන් ලබා නොදීම,

සමාන සාමාජික අවස්ථාවන් ලබා නොදීම,

ආගමික නිදහස අහිමි කිරීම හා

අධිකරණය ඉදිරියේ සමාන අවස්ථා ලබා නොදීමය වශයෙනි.

භාරතීය සමාජයේ උසස් කුලවලට පැවරී තිබුණ රාජ්‍ය පාලන බලතල එකල පහත් කුලවල අයට හිමි නොවීය. පාලන බලතල ලබා ගැනිම තබා පාලන කටයුතු සම්බන්ධයෙන් අදහස් දැක්වීම ද තහනම්ව තිබූ බව පෙනේ. ශුද්‍රයා සිය ස්වාමියා විසින් නිදහස් කරන ලද්දේ නමුදු ඔහු ශුද්‍ර තත්වයෙන් ම සිටිය යුතු යැයි නියම කිරීමෙන් කුල හීනයන්ට තම තත්ත්වය අභිබවා යෑමේ ඉඩ අහිම වී තිබූ ආකාරය තේරුම් ගත හැකි ය.

පහත් කුලවල අයට ස්වයං ජීවන වර්ධනයකට, ජීවන තත්ත්වය දියුණු කර ගැනීමට අවකාශ නොලැබුණි. ඉගෙනීම, ධනය ඉපැයීම හා උසස් වැඩ කිරීම ශුද්‍රයාට තහනම් විය. යම් ශුද්‍රයකු ධනයක් රැස් කළ හොත් ඒ ධනය රාජ සන්තක කරන අතර, ශුද්‍රයා රටින් පිටිවහල් කළ යුතු ය. ඒ ධනය බමුණා විසින් ද පැහැර ගනු ලැබේ. ශුද්‍රයන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය සම්පූර්ණනේ අහිමි විය. වේද පාඨ කීම බරපතළ වරදක් ලෙස සලකන ලදී. ශුද්‍රයන්ට අධ්‍යාපනය දීමට ඉදිරිපත් වන බමුණා ද දඬුවම් ලැබිය යුත්තෙක් විය. මනු නීතියට අනුව බ්‍රාහ්මණයන්ට ශුද්‍රයන්ට ඇසෙන සේ වේද ග්‍රන්ථ කියවීම පවා තහනම් කොට තිබිණි. ශුද්‍රයකු වේදය ඇසුව හොත් ඔහුගේ කන්වල ඊයම් හෝ ලාකඩ පිරවිය යුතු යැයි ද, වේදය කිව හොත් දිව කැපිය යුතු යැයි ද, වේදය පාඩම් කර ගත හොත් මරා දැමිය යුතු යැයි ද සඳහන් වේ.

බ්‍රාහ්මණික කුල ස්තරායනයේ ඉහළ කුලවලට හිමිව තිබූ අධ්‍යාපනය ලැබීමේ වරම් ශුද්‍රයන්ට ලබා දී නොමැති බව ස්වභාධර්මයෙන් ද ප්‍රකට ය.

ආගමික වශයෙන් පහත් යැයි සම්මත කුලවලට කිසිදු අයිතියක් හිමි නොවීය. මනු නීතියට අනුව ශුද්‍රයකුට ආගමික චාරිත්‍ර විධි හා තපස්ක්‍රම යම් බ්‍රාහ්මණයකු උගන්වන්නේ නම් ඔහු අසංවෘත නම් අපායේ වැටෙන බව සඳහන් වේ. වේද ඥානය ලැබීමට අවකාශයක් නොමැති නිසා තමා උදෙසා ආගමික වතාවත් කර ගැනීමට ද අවසර නොලැබුණි. මේ නිසා ශුද්‍රයන්ට ආධ්‍යාත්මික සහනයක් ලැබීමේ ඉඩ ප්‍රස්ථාව ද අහිමි විය.

මිනිසුන් උස් පහත් වශයෙන් වර්ග කිරීමට ගන්නා ලද උත්සාහයේ හෝ කිසියම් විශ්වාසයක් නිසා හෝ මෙලෙස ඇති වූ මානව වර්ගීකරණය පුද්ගලයා සමානාත්වයෙන් නොසැලකීමටත්, එක් ජන කොට්ඨාශයක් භුක්ති විඳින වරප්‍රසාද හා අයිතිවාසිකම් තවත් ජන කොට්ඨාශයකට භුක්ති විඳිමේ අවකාශයක් අහිමි කළේ ය. මෙකී සමාජ ව්‍යුහයත් එහි ක්‍රියා කාරිත්වයත් දැඩි ලෙස විවේචනයට ලක් කරන බුදුසමය මානව වර්ගයාගේ ඒකත්වයත් කුල වාදයේ ජන්මීය පදනමත් යුක්ති සහගත හා තර්කානුකූල නොවන බව පෙන්වා දෙමින් සමාජයේ සියලු මිනිසුන්ට සමාන අයිතිවාසිකම් ලබා දීමට උත්සාහවත් වී තිබේ.

# එස්.මහින්ද හිමි ගුණ සමරු සමස්ත ලංකා දහම් පාසල් රචනා තරගයේ ත්‍යාග හා සහතික ප්‍රදානෝත්සවයෙන්

එස්.මහින්ද හිමි අනුස්මරණ සමස්ත ලංකා දහම් පාසල් අතර, පවත්වනු ලැබූ ගද්‍ය, පද්‍ය රචනා තරගාවලියේ ජයග්‍රාහක දරුවන් හට සහතික පත් සහ තෑගි බෙදා දීමේ උත්සවය පානදුර අලුබෝමුල්ලේ ශ්‍රී සුධර්මාරාම විහාරස්ථානයේදී පසුගිය දා පවත්වනු ලැබීය.

මැදපෙරදිග හෙළබිම සංවිධානයේ මූල්‍ය අනුග්‍රහයෙන් සහ පූජ්‍ය බෙංගමුවේ නාලක ස්වාමින් වහන්සේගේ අනුශාසකත්වයෙන් යුතුව විහාරාධිපති අඹකොළවැව ධම්මදස්සි ස්වාමින් වහන්සේගේ සහ විහාරස්ථ දායක සභාවේත් නව ලංකා දහම් පාසලේත් සංවිධායකත්වයෙන් මෙම උත්සවය පවත්වන ලදී.

මූලාසනය හෙබවූයේ පූජ්‍ය හෙවිස්සේ නන්දාරාම නාහිමියන් විසින් වන අතර, වික්‍රමශිලා පරිවේණාධිපති, දර්ශනපති, රොටුඹ පේමරතන හිමියන්, හෙළබිම අනුශාසක බෙංගමුවේ නාලක හිමියන් සහ අඹකොළවැව ධම්මදස්සි හිමියන් ඇතුළු මහා සංඝරත්නය සහභාගි වූහ.

එමෙන්ම, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් සුනන්ද කාරියප්පෙරුම මහතා නියෝජනය කරමින් දහම් පාසල් කොමසාරිස් වසන්ත ලියනගේ මහතා, ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්.සුනිල් මහතා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ ඩග්ලස් මහතා, පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරි අනුෂි මහත්මිය, මහාචාර්ය ලලිතසිරි ගුණරුවන් මහතා ඇතුළු ගුරු භවතුන් ප්‍රධාන ප්‍රදේශවාසී පින්වතුන් සහ දූ දරුවන් විශාල පිරිසක් සහභාගි වූහ.

රචනා තරගාවලියේ ජයග්‍රාහී දූ දරුවන් ප්‍රමුඛ ඔවුන්ගේ දෙමාපියන් හා දහම් පාසල් ගුරු භවතුන් දිවයිනේ දුර බැහැර ප්‍රදේශවල සිට පැමිණ සහභාගි වූහ.

සෑම වසරකම හෙළබිම සංවිධානයේ මූල්‍ය දායකත්වයෙන් දහම් පාසල් දරුවන් අතර, සිදු කෙරෙන එස්.මහින්ද හිමි අනුස්මරණ ගද්‍ය සහ පද්‍ය රචනා තරගාවලිය සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් සුනන්ද කාරියප්පෙරුම මහතාගේ සහ දහම් පාසල් කොමසාරිස්තුමාගේ නිල අනුග්‍රහය ආයතනික මට්ටමින් ලැබීමෙන් මෙවර උත්සවය වඩාත් ඵලදායි ලෙස පැවැත්වීමට හැකි විය.

දිවයින පුරා පිහිටි දහම් පාසල් 11000 කට අධික සංඛ්‍යාවක ඉගෙනුම ලබන දරුවන් අතරින් ලබා ගත් රචනා අතුරෙන් එක් කාණ්ඩයකින් 10 දෙනා බැගින් දරුවන් 20 දෙනකු තෝරා ගත් අතර, පළමු ස්ථාන ලබා ගත් දරුවන් 6 දෙනාටම ලැප්ටොප් පරිගණක ලබාදීමටත්, ඉතිරි ජයග්‍රාහක දරුවන් 14 දෙනාටම සහතිකපත් සහ රු.10,000 බැගින් වූ මූල්‍ය පරිත්‍යාගයක් කිරීමටත් කටයුතු යොදා තිබිණ.

මීට අමතරව ඉදිරිපත් වූ රචනා අතුරින් කුසලතාවයන් දැක්වූ දරුවන් 50කට ඇගයීම් සහතික පත් පිරිනැමීම සඳහා කටයුතු යොදා ඇත.

### ගද්‍ය රචනා තරගයේ ජයග්‍රාහක දරුවෝ

1. සයුරි නිම්නදු කලන්සූරිය, සිරිරතන දහම් පාසල, උලුවිටකේ
2. වයි. ජී. ඉශානිකා මධුශානි තිලකරත්න, ශ්‍රී පාරමිතා දහම් පාසල, පුස්සැල්ලාව
3. එම්.සශ්මි කාවින්දි, ශ්‍රී ධර්මෝදය දහම් පාසල, ශ්‍රී වර්ධනාරාමය, කුඩාවැව.

### කුසලතා සහතික සහ මූල්‍ය ත්‍යාගලාභීන්

1. එන්.ඩී.කාවින්ද මධුසංක ජයවික්‍රම, ශ්‍රී මේධානන්ද දහම් පාසල, ශ්‍රී ඝානාරාම මහා විහාරය, ඇල්ලගාව
2. ඊ.එම්.මිහිදිනි ශාවින්ද්‍යා එදිරිසූරිය, ශ්‍රී සරණතිස්ස දහම් පාසල, ශ්‍රී කල්‍යානාරාමය, කිරිමැටිතැන්න, බලන්ගොඩ
3. එච්.ජී.රශ්මි එරන්දිකා, ශ්‍රී වික්‍රමසූරිය දහම් පාසල, ප්‍රිය වික්‍රමාරාමය, වා/කනංකේ,ඉමදුව.
4. සලනි දහම්සා, ශ්‍රී සීවලී දහම් පාසල, ශ්‍රී ජයබෝධි මහා විහාරය, ඇතුලත්මුදලිගම, මතුගම
5. ආර්.එම්.එස්.එන්.රත්නායක, ශ්‍රී සාරානන්ද දහම් පාසල, බඹරගස්වැව, ගලේවෙල
6. එම්.ඒ.කාවින්දි දෙව්මි සමර්ථා අරියවංශ, ශ්‍රී සුදස්සි ධර්ම විද්‍යාලය, ශ්‍රී සුදර්මාරාමය, තැඹිලිගස්මුල්ල මාකොළ
7. දැහැමි දිව්‍යාංජලී. සිරි විමලසිරි දහම් පාසල, පුරාණ විහාරය, වනවාසල, කැලණිය

### පද්‍ය රචනා තරගයේ ජයග්‍රාහක දරුවෝ

1. අයි.ඒ.රෂිනි මලීෂා වීරසේකර, ශ්‍රී ධම්මරතන දහම් පාසල, වැබඩ
2. කේ.ඒ.ජේ.සුපිනි සරසි ජයවර්ධන, ශ්‍රී ධම්මරතන දහම් පාසල, වැබඩ
3. එම්.ඒ.සඳලි පුන්සරා, සිරි වජිරවංශ දහම් පාසල, ශ්‍රී දුටුගැමුණු රජමහා විහාරය, සාලියපුර, තිස්ස

### කුසලතා සහතික සහ මූල්‍ය ත්‍යාගලාභීන්

1. ගගන අභිෂේක් යටිවාවල, සිරි සම්බෝධි විහාරස්ථ දහම් පාසල, පල්ලේකැලේ කුණ්ඩසාලේ
2. ඩබ්.ජී.සුපේෂලා අයෝධ්‍යා ධර්මසිරි, ශ්‍රී බෞද්ධාලෝක දහම් පාසල, බෞද්ධාලෝක මාවත, ඇහැලේපොල, පල්ලේපොල
3. එන්.කේ.තරුණි නදිංසා කස්තුරිආරච්චි, ශ්‍රී ධම්මරතන දහම් පාසල, වැබඩ
4. එච්.ජී.නෙත්මි නවෝද්‍යා රාසාංගි, ශ්‍රී සුජාත දහම් පාසල, අභයරාජ විහාරය, දවමොට්ටාව,ආඬි අම්බලම
5. ඩී.එම්. නිර්මාණි, සශ්‍රී, ප්‍රබුද්ධ දහම් පාසල, සූරියපාලුව කඩවත
6. ජී.ජී.දුමින්ද ලක්ෂාන් පියරත්න, ශ්‍රී ප්‍රඥවංශ ප්‍රියදර්ශනාරාම දහම් පාසල, ගවරහෙන බලන්ගොඩ
7. ඩබ්.එම්.දිනිති දම්සිලුමිනි විජේසේකර, ශ්‍රී සුගත විජය දහම් පාසල, ශ්‍රී සුගත විජේසිංහාරාමය, බොරලන්ද
8. කේ.ආර්.ඩී. තනිෂා ධනංජනී, ශ්‍රී ධර්මවිජය ධර්ම විද්‍යාලය, මීගමු පාර පෑලියගොඩ

හෙළබිම සංවිධානයේ අනුශාසක,
ශ්‍රී පඤ්ඤානන්ද ධර්මායතනයේ
**බෙංගමුවේ නාලක අනු නාහිමි**

---

## අඹගහපිටිය යෝගාශ්‍රම විහාරය

බලපිටි පුරවරේ අපගේ පිනට පහළ වූ   බෝධිය
උදේ සවස දෙනෝ දහක් වඳිනා පුදනා   බෝධිය
විමල වාස සමිඳුන්ගේ සුරතින් රෝපිත   බෝධිය
දොහොත් මුදුන් දී වඳිනෙමු සිරස නමා අපෙ   බෝධිය

අඹගහ පිටි 'යෝගාශ්‍රම' පින් බිම තුළ   වැජඹෙන්නේ
සිරිලක තුළ සැදැහැති දන දිනපතාම මෙහි   එන්නේ
හැම දෙනාගෙ සිතුම් පැතුම් එලෙසම ඉටුකර   දෙන්නේ
චිරාත් කාලයක් වැජඹෙනු මැන අප බෝ   සමිඳුන්නේ


**ඩබ්.එම්.කමලා දි. සිල්වා**
**බලපිටිය**



## මිලින

පරවූ මල්වල රුව
පරවෙන නෙත් තුළ රඳවා
ක්ෂණයෙන් ක්ෂණයට පරවෙන
ලොව දෙස බැලුවා

**මාලබේ**
**කේ.ඩබ්ලිව්. සිරිසේන**





## සිතන්නට යමක් ...

දහම අදහම හොඳින් වෙන් වෙන්ව හඳුනා   ගෙන
දැහැමි දිවියක් ගෙවන්නට හොඳින් හිතට   ගෙන
වැඩ කළොත් අප රටේ ගිහි පැවිදි සියලු   දෙන
සම්බුදු සසුන බැබළෙයි ඒ ගැන ද සිතනු   මැන

ඇසූ පමණින් දෙයක් හරියි පිළිගනු   එපා
මෙයයි හරි දහම යැයි හනික පිළිගනු   එපා
බොරුව හරි කරන්නට කරයි සමහරු   උපා
කිසිදෙයක් එකවර හරියි පිළිගනු   එපා

පිළිගන්න එපා අනුමානයට කිසි   දෙයක්
බුදු දමට නොගැළපෙන්නට තිබිය හැක   ඉඩක්
එම කරුණ බුදු දමට ගැලපේවි නම්   හොඳින්
පිළිගන්න විනයානුකූල වන හොඳ   මඟත්

**(කාලාම සූත්‍රය ඇසුරෙනි)**
**මාවනැල්ල**
**රන්දිවෙල විමල් රණසිංහ**




සංස්කරණය
**දීපා පෙරේරා**

## මාවත

ගංගාවක් ලෙසින් එන ගමනෙකි   සසර
සසරින් ගොඩ වෙන්න තරණය කර   කතර
කතරින් වෙර දරා යා යුතු මග   අතර
වෙන මාවතක් නැත නිවනේ සුව   විතර

**මාතලේ සුජාතා සිල්මාතාව**